| පත්තු | - | - | - | 10.792 | - | 39.500 | - | 15 | - | 18 |
| ලේහ | - | - | - | 0.060 | - | 1.290 | - | - | | - |
| පොට්ටනි | - | - | - | 36.160 | - | - | - | 15 | - | 15.4 |
| මැල්ලුම් | - | - | - | 0.220 | - | 30.770 | - | 15 | - | - |
| තැවිලි | - | - | - | 39.53 | - | 40.260 | - | - | - | - |
| පංචවක්කල | - | - | - | - | - | 54.750 | - | - | - | - |

## 2.8 බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණායතනය

### 2.8.1 සායනික පර්යේෂණ හා සංවර්ධන අංශය

| ක්‍රියාකාරකම | භෞතික ප්‍රගතිය | |
|---|---|---|
| | දර්ශකය | ප්‍රමාණය |
| **වර්ෂය තුල ආරම්භ කල හා කරගෙන යනු ලබන ආයතනික පර්යේෂණ** | | |
| ○ කාය චිකිත්සා අංශය | පර්යේෂණ ප්‍රමාණය | 2 |
| ○ ශාලාක්‍ය අංශය | පර්යේෂණ ප්‍රමාණය | 1 |
| ○ අගද අංශය | පර්යේෂණ ප්‍රමාණය | 1 |
| ○ ස්ත්‍රී රෝග හා ප්‍රසූත අංශය | පර්යේෂණ ප්‍රමාණය | 1 |
| ○ වෙනත් | පර්යේෂණ ප්‍රමාණය | 3 |
| **වර්ෂය තුල ප්‍රකාශයට පත් කළ පර්යේෂණ වාර්තා.** | | |
| ○ ස්ත්‍රී රෝග හා ප්‍රසූත අංශය | ජාත්‍යන්තර ප්‍රකාශන | 3 |
| | ජාතික ප්‍රකාශන | 2 |
| **සායනික පුහුණුව ලබාදීම.** | | |
| ○ ආධුනික වෛද්‍ය ශිෂ්‍ය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 75 |
| ○ පශ්චාත් උපාධි ශිෂ්‍ය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 6 |

#### 2.8.1.1 වර්ෂය තුල ආරම්භ කල හා කරගෙන යනු ලබන ආයතනික පර්යේෂණ

1) Development of a feasible Ayurveda formula in the management of *Amlaptitta*
2) *Association between Shvitra Roga (Vitiligo) and poisonous and toxic exposure with special reference to Dushi visha- A Cross-Sectional Survey*
3) Evaluating the Efficacy of *Phalatrikadi Grita* in *Timira* with special reference to Myopia- Randomized Control Clinical Trial
4) Effects of *Dooshivisha* treatment regimen on quality of life of patients with Psoriasis with special reference to *dooshi visha janitha kitima* – Single arm clinical trial
5) A comparative study of *shatapushpa* powder and *patadee* powder in the management of *Granthibhoota artava dushti* w.s.r. PCOS
6) Comparative pharmacognostical and phytochemical study of *Symplocos cochinchinensis* (Lour.) S.Moore. and *Melaleuca leucodendra* (L.)L. stem bark.
7) Association between *Shvitraroga* (Vitiligo) and *Dushivisha* (Poisonous accumulation in the body tissues) - A Cross-sectional Survey
8) Establishment of Pharmacovigilance (Pv) system for Traditional Medicine (TM) products in Sri Lanka (NPD Project)

#### 2.8.1.2 වර්ෂය තුල ප්‍රකාශයට පත් කළ පර්යේෂණ වාර්තා

- **ජාත්‍යන්තර ප්‍රකාශන**

INTERNATIONL JOURNAL OF AYUSH CASE REPORTS (IJA-CARE)

1) Uttara Basti in the Management of Ksheena Shukra w.s.r. to Azoospermia – A Single Case Study
2) Successful Ayurveda Management of Maha Yoni (Uterine prolapse) – A Case Study
3) Katupila (Securinega leucopyrus) and adjuvant Ayurveda Medicines in Karnini Yoni Vyapad (Cervical ectropion with cervicitis) – A Casee Study
4) Agni Karma Treatment in the management of Garbhashaya Greeva Mukha Gata Vrana w.s.r. to Cervical Erosion – A Single Case Study

- **ජාතික ප්‍රකාශන**

JPGIIM

1) A REVIEW OF AYURVEDA INTERVENTIONS IN THE MANAGEMENT OF GYNECOLOGICAL DISEASES: INSIGHTS FROM THE INDOOR PATIENT DIVISION GYNECOLOGY AND OBSTETRICS UNIT OF BANDARANAIKE MEMORIAL AYURVEDA RESEARCH INSTITUTE (BMARI) (JANUARY-SEPTEMBER 2024)
2) ANALYSIS OF DIAGNOSIS TRENDS IN GYNECOLOGY AND OBSTETRICS: BANDARANAIKE MEMORIAL AYURVEDA RESEARCH INSTITUTE – BMARI SRPT UNIT, 2024

### 2.8.2 තත්ත්ව සහතික, පර්යේෂණ හා සංවර්ධන අංශය

| ක්‍රියාකාරකම | භෞතික ප්‍රගතිය | |
|---|---|---|
| | දර්ශකය | ප්‍රමාණය |
| **1. දේශීය ඖෂධ ප්‍රමිතිකරණ සහ තත්ත්ව පාලන** | | |
| ○ ඖෂධ සඳහා ප්‍රමිති පරාමිතීන් සකස් කිරීම, ගුණාත්මකභාවය හා තත්ත්වය සහතික කිරීම. | ඖෂධ සංඛ්‍යාව | 4 |
| **2. පර්යේෂණ සහ සංවර්ධනය** | | |
| ○ වර්ෂය තුළ ආරම්භ කළ හා කරගෙන යනු ලබන ආයතනික පර්යේෂණ. | පර්යේෂණ සංඛ්‍යාව | 3 |
| ○ අනෙකුත් පර්යේෂණ ආයතන, විශ්වවිද්‍යාල සමඟ සහයෝගීව සිදු කරන ලද පර්යේෂණ . | පර්යේෂණ සංඛ්‍යාව | 9 |
| ○ ඖෂධ නිෂ්පාදන සංවර්ධන ආශ්‍රිත පර්යේෂණ. | පර්යේෂණ සංඛ්‍යාව | 3 |
| ○ වර්ෂය තුල ප්‍රකාශයට පත් කළ පර්යේෂණ වාර්තා. | පර්යේෂණ පත්‍රිකා සංඛ්‍යාව | 11 |
| **3. සේවාවන් (තාක්ෂණික සහ ව්‍යාප්ති)** | | |
| ○ නිෂ්පාදන/ ඖෂධ/ අමුද්‍රව්‍ය වල ප්‍රමිතිය නිර්ණය කිරීම සඳහා රසායනාගාර සේවා සැපයීම. | ප්‍රමිතිය පරික්ෂා කළ නිෂ්පාදන/ ඖෂධ සංඛ්‍යාව | 50 |
| ○ විශ්ව විද්‍යාල සිසුන්/ බාහිර ආයතන සඳහා විද්‍යාගාර පහසුකම් හා තාක්ෂණික දැනුම සැපයීම. | සිසුන්/ ආයතන සංඛ්‍යාව | 4 |
| | නියැදි සංඛ්‍යාව | 20 |
| ○ විද්‍යාගාර පරික්ෂණ සම්බන්ධ පුහුණු වැඩසටහන. | මූලික උපාධි අපේක්ෂක ප්‍රතිලාභීන් | 9 |
| | පශ්චාත් උපාධි අපේක්ෂක ප්‍රතිලාභීන් | 3 |
| ○ දේශීය ඖෂධ තත්ත්ව පාලනය සහ ප්‍රමිතිකරණය පිළිබඳ පුහුණු වැඩසටහන. | මූලික උපාධි අපේක්ෂක ප්‍රතිලාභීන් | 220 |
| | ප්‍රතිලාභී ආයුර්වේද සංරක්ෂණ සහා වෛද්‍ය වෘත්තිකයන් | 30 |
| | ප්‍රතිලාභී පාරම්පරික වෛද්‍ය වෘත්තිකයන් | 50 |

#### 2.8.2.1 වර්ෂය තුල ආරම්භ කළ හා කරගෙන යනු ලබන ආයතනික පර්යේෂණ

1) Evaluate and compare the quality of locally manufactured base oils derived from plants used in medicated oil preparations – (Samples were collected (from Northern, North Central, Central & North West provinces), and Testing was carried out from the collected samples 80%)
2) Phyto-chemical and anti-inflammatory analysis of *Piper nigrum* dried fruit decoction
3) Development of standard specification for '*Asamodagam* spirit'

#### 2.8.2.2 අනෙකුත් පර්යේෂණ ආයතන, විශ්වවිද්‍යාල සමඟ සහයෝගීව සිදු කරන ලද පර්යේෂණ

1) Anti-microbial properties of *Cyperus iria* (Thunassa)-Faculty of Allied Health Sciences – Kothalawala Defense University.
2) Phytochemical contrast & anti-oxidant activity of *Cordia dichortama* in Sri Lanka, special reference to anti-diabetic medicinal value -Faculty of Applied Sc., University of Sri Jayewardenapura.
3) Evaluation of microbial load and physico-chemical parameters of Dhathree choorna over a considerable time period- Faculty of Applied Sc. University of Sri Jayewardenapura
4) Assessment of the Impact of *Cyperus rotundus* roots on Improving water quality - FIM, University of Colombo.
5) Evaluation of Microbial, Physicochemical and Phytochemical properties of *Nawarathna* Kalka, An Ayurvedic Polyherbal Drug, over an extended time period. – Sabaragamuwa University of Sri Lanka.
6) Usage of *Clitoria ternatea* flower and Curcuma longa rhizome to develop a natural stain to examine human blood cells - Faculty of Allied health Sciences - Kothalawala Defense University.
7) Development of an Anti-dandruff shampoo using *Acacia concinna*, *Citrus aurantifolia* and *Trigonella foenum- graecum* - Faculty of Applied Sc. University of Sri Jayewardenapura
8) Development of an herbal antifungal cream by using *Cassia tora, Albizia lebbeck* and *Mimosa pudica.*- Faculty of Applied Sc. University of Sri Jayewardenapura
9) Development of herbal balm or the intervention of upper respiratory track symptoms using *Kolashleshmawa* oil- Traditional Medicine Preparation. - Faculty of Applied Sc. University of Sri Jayewardenapura

#### 2.8.2.3 ඖෂධ නිෂ්පාදන සංවර්ධන ආශ්‍රිත පර්යේෂණ

1) Development of herbal Scalp care product
2) Development of low sugar herbal jam/ spread using Thumba karawila
3) Development of immune enhancing herbal gummy

#### 2.8.2.4 වර්ෂය තුල ප්‍රකාශයට පත් කළ පර්යේෂණ වාර්තා

1) Uyangoda I.S.S.C., Munasinghe M.L.A.M.S.,Nawarathne T.K.; '**A Comparative Analysis of *Piper longum* and *Piper sarmentosum* Utilizing Thin-Layer Chromatography and Gas Chromatography-Mass Spectrometry in Exploring the Potential in Sri Lankan Traditional Medicine'** Proceedings of the 28th International Forestry and Environment Symposium (2024), University of Sri Jayewardenepura.

2) Uyangoda I.S.S.C., Munasinghe M.L.A.M.S.,Nawarathne T.K.; **'Comparative phytochemical screening and thin later chromatography development for soxhlet and ultrasound-assisted extracts of *Piper longum* (Thippili) and *Piper sarmentosum* (Gas thippili) grown in Sri Lanka'** Proceedings of 11th Ruhuna International Science & technology Conference, University of Ruhuna, Matara, Sri Lanka.

3) K.H. Maleesha, S.L.A. Lakshika , M.M.K. Peiris, T. K. Nawarathna;' **Preliminary phytochemical screening of *Cyperus iria* leaves and roots,** Proceedings of 2nd International Research Symposium on Traditional Medicine (AyurEx)2024, Faculty of Graduate Studies, University of Kelaniya.

4) K.L.A.Y. Chathurammi, A. Manoraj, T.K. Nawarathne,R.K. Jayarathne; **Comparative microbiological and physico-chemical study on Dhatri churna available in the local market – towards standardization,** , Proceedings of 2nd International Research Symposium on Traditional

5) W.A.R.P. Weerasingha , I.A.M. Leena, R.K. Jayaratne, T.K.Nawarathna; **Evaluation of physicochemical properties and microbiological quality of Vidārikandādī chūrna, a polyherbal Ayurveda pediatric preparation**, Proceedings of 2nd International Research Symposium on Traditional Medicine (AyurEx)2024, Faculty of Graduate Studies, University of Kelaniya.

6) Uyangoda I.S.S.C., Munasinghe M.L.A.M.S.1, Wijesekara I., Nawarathne T.K.; **Exploring the Antioxidant Potential of the Aqueous Extracts of Piper sarmentosum Towards the Development of Novel Functional Candy**, Proceedings of 2nd International Research Symposium on Traditional Medicine (AyurEx) 2024, Faculty of Graduate Studies, University of Kelaniya.

7) T.K. Nawarathna, K.L.A.Y. Chathurammi, W.P.C.S. Weerawaradana, R.K. Jayarathne , A. Manoraj; **Comparative quality assessment of different market samples of a Sri Lankan Traditional medicine 'Desandun Kalka'; towards standardization**, Proceedings of 2nd International Research Symposium on Traditional Medicine (AyurEx)2024, Faculty of Graduate Studies, University of Kelaniya

8) W.P.C.S.Weerawaradana ,W.T.P.S.K. Senerath 1,T. K.Nawarathne ; **Phytochemical screening of Cordia dichotoma (Boraginaceae) bark extracts using Thin Layer Chromatography (TLC),**Proceedings of 2nd International Research Symposium on Traditional Medicine (AyurEx)2024, Faculty of Graduate Studies, University of Kelaniya.

9) U.E. Lokuthotahewa , P.A. Paranagama and S.K.M.K. Herapathdeniya; **Determination of drug safety of Ramabana Rasaya in the Sri Lankan herbal industry,** Proceedings of 2nd International Research Symposium on Traditional Medicine (AyurEx)2024, Faculty of Graduate Studies, University of Kelaniya.

10) K.H. Maleesha, S.L.A. Lakshika , M.M.K. Peiris, T. K. Nawarathna; **Evaluation of Phytochemical and Anti-microbial properties of Cyperus iria,** Proceedings of 2nd International Conference on Frontiers in Chemical Technology, Institute of Chemistry Ceylon.

11) W.A.R.P. Weerasingha , I.A.M. Leena, R.K. Jayaratne3, T.K.Nawarathna; **Evaluation of physicochemical properties and microbiological quality of Ashokarohini chūrna, a polyherbal Ayurveda pediatric preparation**, Proceedings of 2nd International Conference on Frontiers in Chemical Technology, Institute of Chemistry Ceylon.

### 2.8.3 ඖෂධීය ශාක අංශය

| ක්‍රියාකාරකම | භෞතික ප්‍රගතිය | |
|---|---|---|
| | දර්ශකය | ප්‍රමාණය |
| **1. පර්යේෂණ සහ සංවර්ධනය** | | |
| ○ වර්ෂය තුල ආරම්භ කළ හා කරගෙන යනු ලබන ආයතනික පර්යේෂණ. | පර්යේෂණ සංඛ්‍යාව | 3 |
| ○ අභ්‍යන්තර අංශ සමඟ සහයෝගීව සිදු කරන ලද පර්යේෂණ . | පර්යේෂණ සංඛ්‍යාව | 1 |
| ○ අනෙකුත් පර්යේෂණ ආයතන, විශ්ව විද්‍යාල සමඟ සහයෝගීව සිදු කරන ලද පර්යේෂණ . | පර්යේෂණ සංඛ්‍යාව | 7 |
| ○ වර්ෂය තුළ ප්‍රකාශයට පත් කළ පර්යේෂණ වාර්තා. | පර්යේෂණ සංඛ්‍යාව | 3 |
| ○ ආදිවාසී ප්‍රජාව භාවිතා කරන ඖෂධීය ශාක පිළිබඳව සමීක්ෂණය- ගල්ඔය ජාතික උද්‍යානය. (වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තු සහයෝගීත්වය සහිතව) | අවසන් කළ වැඩ ප්‍රතිශතය | 100% |
| ○ ප්‍රකාශන. | අවසන් කළ වැඩ ප්‍රතිශතය | 75% |
| ○ ශාක හා අමුද්‍රව්‍ය නිදර්ශක හඳුනාගැනීම. | අවසන් කළ වැඩ ප්‍රමාණය | 239 |
| **2. උද්‍යාන සංවර්ධනය** | | |
| ○ උද්‍යාන අලංකරණය සඳහා ඇස්තමේන්තු සැකසීම (රාජකීය උද්භිද උද්‍යානයේ තාක්ෂණික සහාය සහිතව) | අවසන් කළ වැඩ ප්‍රතිශතය | 100% |
| ○ අභ්‍යන්තර ජල පොකුණ අළුත්වැඩියා සඳහා ඇස්තමේන්තු සැකසීම (වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ තාක්ෂණික සහාය සහිතව) | අවසන් කළ වැඩ ප්‍රතිශතය | 100% |
| **3. සේවාවන් (තාක්ෂණික සහ ව්‍යාප්ති)** | | |
| ○ පුහුණු හා දැනුවත් කිරීමේ වැඩමුළු. | වැඩමුළු ප්‍රමාණය | 07 |
| ○ ඖෂධ උද්‍යාන සැකසීම සඳහා තාක්ෂණික සහාය සැපයීම. | අවසන් කළ වැඩ ප්‍රතිශතය | 100% |
| ○ ශාකාගාර නිදර්ශක 100ක් යාවත්කාලීන කිරීම. | අවසන් කළ වැඩ ප්‍රතිශතය | 100% |
| ○ ඖෂධ උද්‍යාන නඩත්තුව හා පැළ නිකුත්කිරීම. | නොමිලේ නිකුත් කළ ප්‍රමාණය | 1263 |
| | අලෙවි කළ ප්‍රමාණය | 5855 |
| | ක්ෂේත්‍රයට එක් කළ ප්‍රමාණය | 206 |
| ○ ඖෂධ උද්‍යානය නැරඹීමේ පහසුකම් සැලසීම. | | |
| • අධ්‍යයන කටයුතු. | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 76 |
| • පර්යේෂණ කටයුතු. | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 41 |
| • විදේශීය සංචාරකයන්. | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 07 |
| • දේශීය සංචාරකයන්. | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 158 |

### 2.8.3.1 වර්ෂය තුළ ආරම්භ කළ හා කරගෙන යනු ලබන ආයතනික පර්යේෂණ

1) Pharmacognostic, chemical and clinical research on verification of suitability of adulterant/ substitutes mentioned in Ayurveda Pharmacopoeia used for *Ashtawarga*.
2) Identifying the types of Kinda & Babila plants used in indigenous medicine systems through ethno- botanical surveys and verifying the suitability of their medicinal uses through botanical, chemical and clinical research.
3) Development of pharmacognostic and chemical standards for the proper identification of selected 10 medicinal plant raw materials.

### 2.8.3.2 අභ්‍යන්තර අංශ සමඟ සහයෝගීව සිදු කරන ලද පර්යේෂණ

1) Project on development of quality parameters for the quality control of selected herbal products used in Ayurveda.

### 2.8.3.3 අනෙකුත් පර්යේෂණ ආයතන, විශ්ව විද්‍යාල සමඟ සහයෝගීව සිදු කරන ලද පර්යේෂණ

1) Morphometric, molecular and chemical characterization of *Piper longum* L. morphotypes in Sri Lanka. University of Kelaniya
2) Phytochemical analysis of *Ocimum sanctum* L. and development of Mosquito repellent balm. University of Sri Jayewardenepura
3) Phytochemical & Antimicrobial studies on leaves of *Melaleuca* spp. in Sri Lanka: potential for development of herbal product. University of Sri Jayewardenepura
4) Pharmacognostic & chemical analysis to identify roots of *Clerodendrum serratum* & *C. indicum* for its usage as substitute for genuine ***Siritekku.*** University of Sri Jayewardenepura
5) Phytochemical & antimicrobial studies to evaluate effectiveness of the bark of *Polyalthia longifolia* on dermatological diseases. University of Sri Jayewardenepura
6) Phytochemical & microbiological studies on *Rhinacantus nasutus* & *R. polonnaruwensis* potential for develop herbal product for skin diseases. University of Sri Jayewardenepura
7) Cassia spectabilis (Kahakona) underutilized medicinal plant in Sri Lanka; Phytochemical & microbiological studies to develop herbal product for external application. University of Sri Jayewardenepura

### 2.8.3.4 වර්ෂය තුල ප්‍රකාශයට පත් කළ පර්යේෂණ වාර්තා

1) Rihana, M.H.F., Munasinghe, M.L.A.M.S., and **Edirisinghe, E.A.B.** (2024), Phytochemical analysis and Mosquito repellency evaluation of *Ocimum sanctum* L. , Proceedings of 24$^{th}$ International Postgraduate Research Conference.

2) Edirisinghe, E.A.B., Jeewandara, M.P., Gamage, S.U., Sugathadasa., K.S.S.(2024), A Morpho anatomical and Chemical Studies of *Coleus hadiensis* ( Forssk.) A.J.Paton., Proceedings of INAUGURAL REASERACH SYMPOSIUM 2024,organised by Sri Lankan college of state scientists and ministry of public administration.

3) **Jeewandara, M.P., Edirisinghe, E.A.B., Sugathadasa., K.S.S.** (2024), Pharmacognostic Evaluation of *Alpinia calcarata* Roscoe (Heen araththa) Used in Ayurveda, Proceedings of INAUGURAL REASERACH SYMPOSIUM 2024,organised by Sri Lankan college of state scientists and ministry of public administration.

### 2.8.3.5 ඖෂධ උද්‍යානය - පැළ තවාන






### 2.8.4 සාහිත්‍ය පර්යේෂණ අංශය

| ක්‍රියාකාරකම | භෞතික ප්‍රගතිය | |
|---|---|---|
| | දර්ශකය | ප්‍රමාණය |
| **1. පුස්තකාල සංවර්ධනය** | | |
| ○ (පාරම්පරික දැනුම සංරක්ෂණ ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රතිපාදන මත කැලණිය විශ්වවිද්‍යාලයීය පුස්තකාලයේ තාක්ෂණික දායකත්වයෙන් සිදු කරන ලදී) | | |
| ○ පුස්තකාල පොත් සංගණනය. | ග්‍රන්ථ සංඛ්‍යාව | 949 |
| ○ පරිශීලක පහසුව සඳහා වර්ණ සහිත අංකනය හා පරිශීලක ලැයිස්තුවක් සැකසීම. | ග්‍රන්ථ සංඛ්‍යාව | 3092 |
| ○ පුස්තකාල ග්‍රන්ථ එකතුව වර්ධනය කිරීම. | පරිත්‍යාග සංඛ්‍යාව | 75 |
| **2. පුස්කොළ පොත් සංරක්ෂණය** | | |
| ○ (පාරම්පරික දැනුම සංරක්ෂණ ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රතිපාදන මත ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ තාක්ෂණික දායකත්වයෙන් සිදු කරන ලදී) | | |
| ○ පුස්කොළ පොත් වර්ගීකරණය හා නාමකරණය. | ග්‍රන්ථ සංඛ්‍යාව | 377 |
| ○ පුස්කොළ පොත් කළු මැදීම හා පත් ඉරූ පිළිසකර කිරීම. | ග්‍රන්ථ සංඛ්‍යාව | 377 |
| ○ පුස්කොළ පොත් සඳහා කම්බා එකතු කිරීම. | කම්බා ප්‍රමාණය | 265 |
| ○ පුස්කොළ පොත් අනුලේඛනය කිරීම. | අවසන් කළ ප්‍රමාණය | 8 |
| | ක්‍රියාකරමින් පවතින ප්‍රමාණය | 2 |
| ○ අනුලේඛනය කළ පුස්කොළ පොත් මුද්‍රණය කිරීම. | අවසන් කළ ප්‍රමාණය | 2 |
| | මුද්‍රණය සඳහා යොමු කර ඇති ප්‍රමාණය | 4 |
| | මුද්‍රණයට සූදානම් කර ඇති ප්‍රමාණය | 2 |
| **3. පුස්තකාල සේවා** | | |
| ○ සාහිත්‍ය පර්යේෂණ කටයුතු සඳහා පුස්තකාල සේවා පහසුකම් සැලසීම. | අභ්‍යන්තර කාර්යය මණ්ඩල ප්‍රතිලාභීන් | 119 |
| | සීමාවාසික වෛද්‍ය ප්‍රතිලාභීන් | 17 |
| | උසස් අධ්‍යාපන සිසුන් (රුහුණු වි.වි., ශ්‍රී ජයවර්ධනපුර වි.වි., පේරාදෙණිය වි.වි., කොළඹ වි.වි., SLIIT) | 16 |

### 2.8.5 පාරම්පරික දැනුම සංරක්ෂණ ව්‍යාපෘතිය

| ක්‍රියාකාරකම | භෞතික ප්‍රගතිය | |
|---|---|---|
| | දර්ශකය | ප්‍රමාණය |
| 1. පාරම්පරික දේශීය වෛද්‍යවරුන් පිළිබඳ සංගණනය කිරීම, ගුරු කුළ හඳුනාගැනීම, ඊට අදාළ තොරතුරු පදනම් කරගෙන වෛද්‍ය පරම්පරා හා වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ලේඛණයක්, දත්ත පද්ධතියක් හා විද්‍යුත් පුස්තකාලයක් ස්ථාපිත කිරීම. | | |
| ○ දත්ත රැස්කිරීමට තොරතුරු පත්‍රිකා මුද්‍රණය කිරීම. | පත්‍රිකා ප්‍රමාණය | 22500 |
| ○ දත්ත පත්‍රිකාව පිලිබඳව පළාත් සහා මට්ටමින් දනුවත් කිරීමේ වැඩමුළු පැවැත්වීම. | වැඩමුළු සංඛ්‍යාව | 3 |
| ○ පරිගණක මෘදුකාංගය නිර්මාණය කිරීම සඳහා මොරටුව විශ්ව විද්‍යාලයේ එන්ටප්‍රයිසස් අංශය සමඟ ගිවිසුම්ගතවීම. | පරිගණක මෘදුකාංග | 1 |
| 2. පාරම්පරික දැනුම සංරක්ෂණ ව්‍යාපෘතියට සමගාමී කටයුතු. | | |
| ○ පුස්තකාල සංවර්ධනය සඳහා මූල්‍ය ප්‍රතිපාදන ලබාදීම. | අවසන් කළ වැඩ ප්‍රතිශතය | 100% |
| ○ පුස්කොළ පොත් සංරක්ෂණය සඳහා මූල්‍ය ප්‍රතිපාදන ලබාදීම. | අවසන් කළ වැඩ ප්‍රතිශතය | 100% |

### 2.8.6 පර්යේෂණ ආචාරධර්ම සමාලෝචන කමිටුව (ERC)

| ක්‍රියාකාරකම | භෞතික ප්‍රගතිය | |
|---|---|---|
| | දර්ශකය | ප්‍රමාණය |
| පර්යේෂණ ව්‍යාපෘති සමාලෝචනය කිරීම | අවසන් කළ ප්‍රමාණය | 15 |
| | ක්‍රියාකරමින් පවතින ප්‍රමාණය | 6 |
| පර්යේෂණ ව්‍යාපෘති අනුමත කිරීම | අනුමත කළ ප්‍රමාණය | 14 |
| පර්යේෂණ ව්‍යාපෘති ප්‍රතික්ෂේප කිරීම | ප්‍රතික්ෂේප කළ ප්‍රමාණය | 0 |
| පර්යේෂණ ව්‍යාපෘති ඉවත්කරගැනීම | ඉවත් කරගත් ප්‍රමාණය | 0 |

### 2.8.7 විශේෂ ක්‍රියාකාරකම්

- භාණ්ඩාගාර මූල්‍ය ප්‍රතිපාදන ලබාගැනීමේ දී ආයුර්වේද පර්යේෂණායතනය හා ආයුර්වේද රෝහල ලෙස වැය ශීර්ෂ වෙන්කරවා ගැනීම.
- දේශීය වෛද්‍ය පර්යේෂණ හා නිෂ්පාදන සම්බන්ධ **බුද්ධිමය දේපල අයිතිය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය** සකස් කර අවසන් කිරීම.
- **ඖෂධ සංග්‍රහයට** නෛතිකභාවය ලබාගැනීමට අවශ්‍ය මූලික කටයුතු අවසන් කිරීම.

- ආයතන ප්‍රතිව්‍යුහගත කිරීමේ යෝජනාවලිය සකස් කිරීම.
- **ශ්‍රී ලංකාවේ විද්‍යා හා තාක්ෂණ ජාතික සමාලෝචනය 2023/2024** ට අදාළ සමීක්ෂණ වාර්තාව සඳහා ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව වෙත බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණායතන තොරතුරු ඉදිරිපත් කිරීම.

## 2.9 දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනය

| අංකය | ප්‍රධාන වැඩසටහන /ව්‍යාපෘතිය | භෞතික ප්‍රගතිය | | මූල්‍ය ප්‍රගතිය (රු) |
|---|---|---|---|---|
| | | වැඩසටහන් සංඛ්‍යාව | ප්‍රතිලාභීන් සංඛ්‍යාව / මොඩියුල සංඛ්‍යාව | |
| 1 | පාඨමාලා සඳහා මොඩියුලය සහ විෂයමාලා සකස කිරීම්, සමාලෝචනය හා ප්‍රමිතිගත කිරීම | 7 | මොඩියුල් - 03<br>අත්පොත් - 02 | 109,301.50 |
| 2 | සීමාවාසික වෛද්‍ය පුහුණුව | 6 | පුහුණුලාභීන් -677 | 971,723.45 |
| 3 | පාරම්පරික වෛද්‍යවරුන් සඳහා වූ පුහුණු වැඩසටහන් | 10 | පුහුණුලාභීන් - 496 | 1,214,725.00 |
| 4 | ආයුර්වේද වෛද්‍ය නිලධාරීන් සඳහා ධාරිතා පුහුණු වැඩසටහන් | 14 | පුහුණුලාභීන් -466 | 1,331,991.80 |
| 5 | ප්‍රජා සෞඛ්‍යය ආයුර්වේද වෛද්‍ය නිලධාරීන් සඳහා | 4 | පුහුණුලාභීන් -81 | 338,702.00 |
| 6 | වෛද්‍ය සහායක කාර්ය මණ්ඩලය සඳහා පුහුණු වැඩසටහන් | 8 | පුහුණුලාභීන් -310 | 701,072.32 |
| 7 | අනධ්‍යන කාර්ය මණ්ඩලය සඳහා ධාරිතා පුහුණු වැඩසටහන් | 5 | පුහුණුලාභීන් -86 | 587,910.00 |
| 8 | වැඩිහිටි සත්කාර වැඩසටහන | 9 | පුහුණුලාභීන් -305<br>මොඩියුල-02<br>අත්පොත්- 03 | 2,611,466.02 |
| 9 | විශෙෂ වැඩීසටහන් | 3 | පුහුණුලාභීන් -193 | 83,045.00 |
| 10 | පෞද්ගලික පාඨමාලා | 1 | පුහුණුලාභීන් -20 | 461,067.50 |
| එකතුව | | **67** | **පුහුණුලාභීන් -2634**<br>**මොඩියුල-05**<br>**අත්පොත්- 05** | **8,379,804.59** |

## 2.10 ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධන සේවය - අනුරාධපුරය

| අංකය | වැඩසටහන | වැඩසටහන් විසතරය් | වැඩසටහන් ගණන | ප්‍රතිලාභීන් |
|---|---|---|---|---|
| 1 | වැඩිහිටි සත්කාරක වැඩසටහන | 1.I. සායන සංඛ්‍යාව | 130 | 4056 |
| | | II. යොමු කල රෝගීන් සංඛ්‍යාව | 22 | |
| | | 2.I. රෝගීන් හදුනාගැනීමේ මූලික පරික්ෂණ වැඩසටහන් ගණන | 15 | 479 |
| | | 3.I. දැනුවත් කිරිමේ වැඩසටහන් සංඛ්‍යාව | 392 | 4879 |
| | | 4.I.යෝග වැඩසටහන් සංඛ්‍යාව | 52 | 918 |
| | | 5.I. භාවනා වැඩසටහන්/මානසික සෞඛ්‍ය වැඩසටහන් සංඛ්‍යාව | 148 | 2585 |
| | | 6.I.පෝෂණ වැඩසටහන් සංඛ්‍යාව | 76 | 1167 |
| | | 7.I .වෙනත් වැඩසටහන් -වැඩිහිටියන් අධීක්ෂණය- සායනික පර්යේෂණ (ගෘහ පිවිසුම්) | 6893 | 8669 |
| 2 | හෙළවිරු සුවධරණී සුවසෙවා වැඩසටහන | 1.I. සායන සංඛ්‍යාව | 66 | 1725 |
| | | 2.I. රෝගීන් හදුනාගැනීමේ මූලික පරික්ෂණ වැඩසටහන් ගණන | 5 | 91 |
| | | 3.I.දැනුවත් කිරිමේ වැඩසටහන් සංඛ්‍යාව | 9 | 225 |
| | | 4.I.යෝග වැඩසටහන් සංඛ්‍යාව | 1 | 14 |
| | | 5.I. භාවනා වැඩසටහන්/මානසික සෞඛ්‍ය වැඩසටහන් සංඛ්‍යාව | 0 | 0 |
| | | 6.I.පෝෂණ වැඩසටහන් සංඛ්‍යාව | 1 | 17 |
| | | 7.I.වෙනත් වැඩසටහන් (සඳහන් කරන්න) | 1 | 44 |
| | | 8.1.අධීක්ෂණය කල නිවාස ගණන | 32 | 135 |
| 3 | ළමා සෞඛ්‍ය සංරක්ෂණය - පෙරපාසල් | 1.I. ළමා සායනික සෙවා ස්ංඛ්‍යාව | 237 | 4677 |
| | | 2.I.දෙමාපිය දැනුවත් කිරිම (පෝෂණ) | 787 | 11528 |
| | | 3. I.පෝෂණ ප්‍රායෝගික වැඩසටහන් ගණන | 583 | 8992 |
| | | 4.I.යෝග වැඩසටහන් ගණන | 25 | 759 |
| | | 5.I.වෙනත් | 454 | 8827 |
| | ළමා සෞඛ්‍ය සංරක්ෂණය -ප්‍රාථමික පාසල් | 1.I. ළමා සායනික සෙවා ස්ංඛ්‍යා | 2 | 79 |
| | | 2.I.ළමා දැනුවත් කිරිම | 12 | 1526 |
| | | 3.I.දෙමාපිය දැනුවත් කිරිම | 10 | 394 |
| | | 4. I.පෝෂණ ප්‍රායෝගික වැඩසටහන් ගණන | 11 | 198 |
| | | 5.I.යෝග වැඩසටහන් ගණන | 3 | 182 |
| | | 6. I.මානසික සෞඛ්‍ය වැඩසටහන් ගණන | 18 | 423 |
| | | 7.I.වෙනත් | 3 | 45 |
| 4 | බෝ නොවන රෝග පාලන වැඩසටහන | 1.I.ජංගම වෛද්‍ය සායන | 53 | 2874 |
| | | II. යොමුකල රෝගීන් ගණන | 12 | |
| | | 2. I. රෝගීන් හදුනාගැනීමේ මූලික පරික්ෂණ වැඩසටහන් සංඛ්‍යාව | 105 | 3220 |
| | | 3.I.රාජකාරි සෙවා ස්ථාන ආශ්‍රිත වෘත්තීය සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන් සංඛ්‍යාව | 54 | 1585 |
| | | 4. I.යෝග සහ සංයම අභ්‍යාස වැඩසටහන් සංඛ්‍යාව | 228 | 2559 |
| | | 5. I.බෝ නොවන රෝග පාලන දැනුවත් කිරිමේ වැඩසටහන් සංඛ්‍යාව | 2239 | 30780 |
| | | 6. I.පෝෂණ දැනුවත් කිරිමේ වැඩසටහන් සංඛ්‍යාව | 308 | 4793 |

| | | | | |
|---|---|---|---|---|
| | | 7. I.පෝෂණ ප්‍රායෝගික වැඩසටහන් සංඛ්‍යාව | 217 | 3548 |
| 5 | බෝ වන රෝග පාලන වැඩසටහන | 1. I.ඩෙංගු රෝග පාලන දැනුවත් කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව | 502 | 6094 |
| | | 2. I.ලීෂ්මනයිසිස් රෝග පාලන දැනුවත් කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව | 1007 | 11949 |
| | | 3. I.මී උණ රෝග පාලන දැනුවත් කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව | 130 | 1857 |
| | | 4. I.වෙනත් දැනුවත් කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව | 1296 | 16918 |
| 6 | පාසල් වැඩසටහන් | 1. I. දැනුවත් කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව (පාසල් සිසුන්/ගුරුවරුන්/දෙමාපියන්) | 39 | 3618 |
| | | 2. I.පෝෂණ ප්‍රායෝගික (දෙමාපියන්) | 2 | 56 |
| | | 3. I. ඖෂධ පැල හා අත්බෙහෙත් හඳුන්වාදීමේ වැඩසටහන් සංඛ්‍යාව | 4 | 241 |
| | | 4.I.යෝග වැඩසටහන් ගණන | 1 | 144 |
| | | 5. I.මානසික සෞඛ්‍ය වැඩසටහන් සංඛ්‍යාව | 3 | 39 |
| | | 6.I. වෙනත් (සඳහන් කරන්න) | 6 | 420 |
| 7 | ඖෂධ පැලෑටි සංරක්ෂණ හා තිරසාර භාවිතය | 1. I තවාන් කරන ලද පැල තවාන් ගණන | 1 | |
| | | II. මාසිකව තවාන් කරනලද ඖෂධ පැල ගණන | 4730 | |
| | | III. බෙදාහරින ලද ඖෂධ පැල ගණන | 85 | 33 |
| | | 2.I. ආදර්ශ ගෙවතු සංඛ්‍යාව (නිලධාරියකුට වසරකටම 05කි. අවුරුද්ද පුරාම මාසිකව අධීක්ෂණය කල යුතුය. | 333 | |
| | | II. කාබනික බෝග සංඛ්‍යාව | 504 | |
| | | III. ඖෂධ පැළ සංඛ්‍යාව | 624 | 396 |
| | | 3.I. ඖෂධ උයන් සංඛ්‍යාව (පාසල්/රාජ්‍ය ආයතන/වෙනත්) | 5 | |
| | | II. මාසය තුළ රෝපිත ඖෂධ පැල ගණන | 268 | |
| | | 5.I.ආර්ථිකමය භෝග ලෙස ඖෂධ වගාව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව(මාසික අධීක්ෂණය පමණක් සලකුණු කරන්න) | 57 | 366 |
| | | 6.I.සරල අත්බෙහෙත් හඳුන්වාදීමේ වැඩසටහන | 168 | 1896 |
| 8 | මාතෘ වැඩසටහන් | 1.I. මාතෘ සංරක්ෂණ දැනුවත් කිරීමේ වැඩසටහන් | 3 | 59 |
| | | 2.I.මාතෘ පෝෂණ වැඩසටහන් සංඛ්‍යාව | 14 | 95 |
| | | 3.I.මාතෘ යෝග වැඩසටහන් සංඛ්‍යාව | 1 | 23 |
| | | 4.I.වෙනත් වැඩසටහන් සංඛ්‍යාව | | |
| | | II. සේවා ලාභීන් සංඛ්‍යාව | | |
| 9 | ගෘහ ඒකක දැනුවත් කිරීම | ගෘහ ඒකක දැනුවත් කිරීම් | 6503 | 16142 |
| 10 | ප්‍රජා සත්කාර වැඩසටහන් | I. විශේෂ වැඩසටහන් සංඛ්‍යාව (වැඩසටහන සඳහන් කරන්න)හිසතෙල් ගෑමේ උත්සව,පාසල්වල ප්‍රථමාධාර හා සෞඛ්‍ය කඳවුරු පැවැත්වීම, ගෙවතු වගා දැනුවත් කිරීම,පිරිසිදු ජල පානය පිළිබඳ දැනුවත් කිරීම,ඩෙංගු මර්දන වැඩසටහන් පැවැත්වීම,මත්ද්‍රව්‍ය පිළිබඳ වැඩසටහන, පොසොන් බත් දන්සල , කුරහන් දන්සල,ජාත්‍යන්තර යෝග දින සැමරුම ,ඖෂපැන් ලබාදීම පෝෂණ ප්‍රදර්ශනය,වැඩිහිටි සත්කාර වැඩසටහන්,යොවුන් දරුවන් සඳහා මානසික සෞඛ්‍ය වැඩසටහන්, යෞවන පෞරුෂත්ව වර්ධනය,වීදි නාට්‍ය ප්‍රදර්ශනය, වෘත්තීය සෞඛ්‍ය වැඩසටහන,මානසික ආතති කළමනාකරණය,ලෝක ළමා දින වැඩසටහන,දියවැඩියා සමීක්ෂණය | 130 | 9289 |

### 2.10.1 බෝ නොවන රෝග පාලන වැඩසටහන

දේශීය වෛද්‍ය අංශයේ හා ආයුර්වේද දෙපාර්තමේන්තුවේ මැදිහත් වීම මත සෞඛ්‍ය අමාත්‍යාංශයේ බෝ නොවන රෝග පාලන වැය විෂය යටතේ ලබාගත් ප්‍රතිපාදන හරහා 2024 ජුනි සිට දෙසැම්බර් දක්වා අප සේවාව හරහා ප්‍රදේශයේ දුෂ්කරතා හා සේවා අවශ්‍යතා අවශ්‍ය පුද්ගලයින් සඳහා සුවිශේෂී සේවා රැසක් සැපයූ අතර ප්‍රතිඵලදායි අරමුණු කරා ළඟාවීමට හැකියාව ලැබී ඇත.

- දුෂ්කර ග්‍රාමයන් ඉලක්ක කර ගනිමින් ආයුර්වේද ජංගම වෛද්‍ය සායන 158ක් සංවිධානය කර පවත්වන ලද අතර ඒ සඳහා 5,135කට සේවා සපයන ලදී. මෙම සායන වැඩිහිටි ,රණවිරු හා ජංගම ලෙස පවත්වන ලදී. මේ සඳහා සහභාගී වූවන්ගෙන් 68%කට වැඩි ප්‍රතිශතයක් අවුරුදු 50ට වැඩි අය වූ අතර වැඩි ප්‍රතිශතයක් එනම් 72%ක් පමණ කාන්තාවන් විය. ඔවුන් අතරින් වැඩි ප්‍රතිශතයක් එනම් 58%ක් (n -2918)පමණ සන්ධි රෝග සඳහා ප්‍රතිකාර ගැනීමට පැමිණි අතර 104ක් පමණ රෝගීන් රජයේ ආයුර්වේද ප්‍රතිකාර මධ්‍යස්ථාන වෙතද ,රෝගීන් 37 ක් පමණ රජයේ බටහිර රෝහල් වෙත යොමු කළ අතර රෝගීන් 75 දෙනෙකු වැඩිදුර වෛද්‍ය පරීක්ෂණ සඳහා යොමු කරන ලදී.
- එමෙන්ම අදාළ ප්‍රතිපාදන ලද වැඩසටහන් යටතේ ප්‍රාථමික පරීක්ෂණ සේවා දුෂ්කර ග්‍රාමයන් ඉලක්ක කර ගනිමින් පවත්වන ලදී. ඒ අනුව පුද්ගලයන් 2,174ක් සඳහා ප්‍රාථමික පරීක්ෂණ සේවා ලබා දෙන අතර ඔවුන්ගෙන් 13.5 %ක් (295ක්)මුත්‍රා සමඟ සීනි පිටවීම හඳුනාගෙන තිබිනි. එමෙන්ම 13.2%ක් අතර ප්‍රමාණයකට මුත්‍රා සමඟ ප්‍රෝටීන පිටවීම හඳුනාගත් අතර සහභාගීවූන්ගෙන් 48.9%ක් (n=1063)එනම්, අධිකට වඩා වැඩි ප්‍රතිශතයක් අධිබර තත්වයේ පසුවුණි. එමෙන්ම 10.94%(N-238)ප්‍රතිශතයක් අඩුබර තත්ත්වයේ විය. මොවුන් සඳහා ප්‍රකෘතිය පදනම් කරගත් උපදෙස් වැඩිදුර ප්‍රතිකාර කරා යොමු කිරීම හා අවශ්‍ය මඟ පෙන්වීම ලබා දෙන ලදී.
- රාජ්‍ය නිලධාරීන් 1,219ක් ඉලක්ක කරගනිමින් ආයුර්වේද වෘත්තීය සෞඛ්‍ය වැඩසටහන් අදාල කාලය තුල සිදුකරන ලදී. මෙම සහභාගී වූ නිලධාරීන්ගේ, PSS -10 මිණුම් දර්ශකය භාවිතා කර ස්වකීය ආතති මට්ටම මැන බලන ලද 1,196ක් වූ රාජ්‍ය සේවා නියැදියකින් සමස්ථයක් ලෙස 80.35% ක (N=961)රාජ්‍ය නිලධාරීන් ආතතියෙන් පීඩා විදි නිසා එය පදනම් කරගෙන ඔවුන් වෙනුවෙන් ත්‍රෛයිමාසික යෝග වැඩසටහන් 22ක් සැලසුම් කරන ලදී. එමෙන්ම සහභාගී වූවන් අවු 53ට වැඩි නිලධාරීන් තෝරාගෙන පූර්ව විශ්‍රාම දිවිය සැලසුම් කිරීම සඳහා අවශ්‍ය උපදෙස් ලබා දෙන ලදී.
  
  එමෙන්ම ඔවුන්ගේ රෝග ඉතිහාසය ආදිය සලකා බලා අවශ්‍ය උපදෙස් ලබා දෙන ලදී. සහභාගී වූ රාජ්‍ය නිලධාරීන් අතරින් 36.6% (n=488)අධිබර පෙන්නුම් කල අතර 10.95%ක් (n=146)පමණ අති ස්ථූල රෝගී අවස්ථාවේ විය. ඔවුන් වැඩිපුර ප්‍රතිකාර කරා යොමු කරවන ලදී.
- සමස්ථයක් ලෙස යෝග වැඩසටහන් 82ක් දිස්ත්‍රික්කය පුරා පවත්වන ලද අතර ඒ සඳහා 790ක් සහභාගී විය. මෙහිදී ශාරිරික, මානසික සෞඛ්‍ය තත්ත්වය හා ශරීර නම්‍යශීලී බව,තුලනය,මානසික ආතතිය අවම වීම ආදිය වැඩසටහනට පෙර හා පසු මැන බැලීම සිදුකරන ලදී.මෙය තවදුරටත් ක්‍රියාකාරිව පවත්වනු ලබන වැඩසටහනකි.
- බෝ නොවන රෝග පාලන යටතේ කලාපයට සුවිශේෂී තර්ජනයක් වූ කාලීන වකුගඩු අක්‍රියවීම, දියවැඩියා, සන්ධි රෝග, අධිරුධිර පීඩනය, පිලිකා රෝග සඳහා මූලිකත්වය ලබාදුන් අතර එවැනි වැඩසටහන් 1,181 පවත්වා 14,907ක් දැනුම්වත් කර රෝගය, රෝගයට හේතුව, රෝග ලක්ෂණ හා රෝග වලක්වා ගැනීම සම්බන්ධ පෙර හා පසු දැනුම්වත් වීමේ ප්‍රගතිය මැන බලන ලදී.
- ග්‍රාමීය මෙන්ම නාගරික ප්‍රජාව ඉලක්ක කරගත් පෝෂණ ගැටළු මඟ හරවා ගැනීම සඳහා වූ ආයුර්වේද පෝෂණ සංකල්ප හඳුන්වාදීමේ දැනුම්වත් කිරිමේ වැඩසටහන් පවත්වනු ලබන අතර මෙම වැඩසටහන් වලද පෙර හා පසු ප්‍රගතිය විමසීම සිදුකරනු ලබයි.

- ❖ හෙළ අහරින් සුවය රකිමු දේශීය ආහාර ජනගත කිරීමේ ප්‍රායෝගික වැඩමුළු මේ යටතේ පවත්වනු ලබයි. විශේෂයෙන් තැම්බුම් හොද්ද වැනි එදා හෙළයන් භාවිතා කල බෝ නොවන රෝග පාලන ක්‍රම වත්මන් ප්‍රජාවට හඳුන්වාදීම මෙහි අරමුණ වන අතර පෙර හා පසු වශයෙන් දැනුම්වත්වීම හා කුසලතා වර්ධනය මැන බැලීම සිදුකරනු ලබයි.
- ❖ ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධන සේවා මාධ්‍ය හා සංස්කෘතික ඒකකයේ වීදි නාට්‍ය කණ්ඩායම විසින් විශේෂයෙන් පෝෂණය ඉහල නැංවීම, බෝ නොවන රෝග පාලනය සඳහා වීදිනාට්‍ය සංදර්ශණ පවත්වා දැනුම්වත් කිරිම් සිදු කර ඇත. මේ වැඩසටහන හරහා සෞඛ්‍ය පණිවිඩ ලබාදීම සිදුකරන අතර වර්ණ කාඩ් ක්‍රමයන් හරහා ප්‍රගතිය ලබා ගනී. 2,106 අත්ප්‍රතිකා බෙදා හැර ඇති අරත 79%සේවාව සම්බන්ධ තෘප්තිමත්ය.

### 2.10.2 පර්යේෂණික හා වෙනත් සේවා

- ❖ 1. Assessment of the knowledge of Ayurveda – inspired culinary practice among the rural community in Sri Lanka: A Before & after study.
  2. Assessment of knowledge in Ayurveda nutritional concepts among preschool mothers: A pre & post study analysis.
  3.Leishmaniasis awareness in Anuradhapura district in Sri Lanka :A cross Sectional survey on etiology clinical features and prevention.

  යන මාතෘකා යටතේ 2024 දෙසැම්බර් ඉන්දියන් උත්තර ප්‍රදේශයේ (දෙහරාදූන් වල පැවති ලෝක ආයුර්වේද සමුළුව වෙත පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කරන ලදී.

- ❖ එමෙන්ම රජරට වෛද්‍ය පීඨයේ වෛද්‍ය ආචාර ධර්ම කමිටු අනුමැතියට යටත්ව අප විසින් දියවැඩියා රෝග සම්බන්ධයෙන් පර්යේෂණ ව්‍යාපෘතියෙන් සිදුකර අවසන් කරන ලදී.( Usage & barriers to access of Traditional & Complementary Medicine for the control of Diabetics Mellitus: A descriptive Community based study in Anuradhapura district)

- ➢ එමෙන්ම රජරට වෛද්‍ය පීඨයේ ECLIPSE ව්‍යාපෘතියේ සහයෝගයෙන් වැලිමැසි උවදුරෙන් වැලැක්වීම සඳහා වූ ප්‍රජා මූලික දැනුම්වත් කිරිම යටතේ පුද්ගලයන් 12,171 දෙනෙකු දැනුම්වත් කර අත්පත්‍රිකාවක්ද ලබා දී ඇත.රෝග හේතුව ,රෝග ලක්ෂණ හා රෝග වළක්වා ගැනීම සම්බන්ධ පෙර හා පසු ප්‍රගතිය අධීක්ෂණය කරනු ලබයි.

- ❖ වෛද්‍ය නිලධාරින් සඳහා වූ පර්යේෂණ හා පෝෂණ සම්බන්ධ වැඩමුළු 03ක් හා ප්‍රජා සෞඛ්‍ය සංවර්ධන නිලධාරි බෝ නොවන රෝග පාලන සම්බන්ධ වැඩමුළුවක්ද පවත්වන ලදී.

- ❖ එමෙන්ම දේශීය වෛද්‍ය ක්‍රම පිළිබද ජාතික ආයතනය ගම්පහ දිස්ත්‍රික් හා අනුරාධපුර ප්‍රජා සෞඛ්‍ය ඒකාබද්ධ වැඩිහිටි සත්කාර පර්යේෂණ වැඩසටහන මේ වන විට අප අඛණ්ඩව පවත්වා ගෙන යනු ලබයි. මෙහිදී පලමු අදියරේ වැඩිහිටියන් 1,800ක් ඉලක්ක කරගත් මූලික සමීක්ෂණය සිදුකර අවසන් කර ඇති අතර වෛද්‍ය නිලධාරි හට මසක පුහුණුවක් ප්‍රජා සෞඛ්‍ය සංවර්ධන නිලධාරින් හට දින 05ක පුහුණුවක් ලබාදී ඇත. මේ වන විට වැඩිහිටි 1,800ක් ඉලක්ක කරගත් වැඩිහිටි ජීවන තත්ත්ව දර්ශක ඉහළ නැංවීම ඉලක්ක කරගත් පර්යේෂණික සායන (යෝග, තෛල අභ්‍යංග තැවීම් ඇතුළත්) ප්‍රජා මට්ටමින් පවත්වාගෙන යනු ලබයි. මීට අමතරව සායනික වැඩසටහන් 13ක් හරහා 4,056ක් වෙත ප්‍රතිලාභ ලබාදී ඇත.

## 2.11 ඉදිරි ඉලක්ක හා අභියෝග

### 2.10.1 ඉලක්ක

1. ජාතික සෞඛ්‍ය පද්ධතිය තුළ වැඩි දායකත්වයක් ලබා දීම සඳහා ආයුර්වේද රෝහල් පද්ධතිය ගුණාත්මකව සහ ප්‍රමාණාත්මකව සංවර්ධනය කිරීම.
2. ආදායම් උත්පාදනය සඳහා දේශීය වෛද්‍ය ව්‍යවසායකත්ව සංවර්ධනය පුළුල් කිරීම.
3. දේශීය වෛද්‍ය ක්ෂේත්‍රයට අදාළ නිෂ්පාදන අපනයනය සඳහා පහසුකම් පුළුල් කිරීම.
4. විදේශයන්ගෙන් ආනයනය කරනු ලබන ඖෂධ මෙරට වගා කිරීම මඟින් ඖෂධ වෙළෙඳපොළ සුලභ කිරීම.
5. වැඩිහිටි සෞඛ්‍ය ප්‍රවර්ධනය සඳහා ක්‍රමවේදයක් සැකසීම.
6. ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් පද්ධතිය සංවර්ධනය කිරීම සඳහා කටයුතු කිරීම.
7. අන්තර් ජාතික මට්ටමේ සමුළු හා ප්‍රදර්ශන පැවැත්වීම.
8. ආයුර්වේද සංරක්ෂණ සහා ලියාපදිංචිය යාවත්කාලීන කිරීම.
9. සාම්ප්‍රදායික වෛද්‍ය ක්‍රම ඇතුළත් අන්තර්ජාතික වෛද්‍ය කලාපයක් ඇති කිරීම.
10. දේශීය ඖෂධ නිෂ්පාදන අපනයනය කිරීම සඳහා දිරිගැන්වීම.

### 2.10.2 අභියෝග

1. ජාතික සෞඛ්‍ය පද්ධතිය තුළ දේශීය වෛද්‍ය අංශයෙන් ඉටුකරනු ලබන කාර්යභාරය පිළිබිඹු නොවීම.
2. වාර්ෂිකව වෙන්වන ප්‍රතිපාදන මත සැලසුම්කර ඇති ඉලක්ක වෙත ළඟා වීමට ඇති නොහැකියාව.
3. මානව හා භෞතික සම්පත් හිඟය.

# 3.පරිච්ඡේදය

## 3. 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන සමසේත මූලය කාර්යසාධනය

### 3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

**2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය**

| සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2024 | | සටහන | තත්‍ය 2024 | 2023 | |
|---|---|---|---|---|---|
| රු. | | | රු. | රු. | |
| - | ආදායම් ලැබීම් | | - | - | |
| - | ආදායම් බදු | 1 | - | - | |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | ඒසීඒ-1 |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | - | - | |
| - | **මුළු ආදායම් ලැබීම් (අ)** | | - | - | |
| - | ආදායම් නොවන ලැබීම් | | - | - | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 2,214,744,456 | 1,822,586,048 | ඒසීඒ-3 |
| - | තැන්පතු | | 231,671,500 | 11,965,626 | ඒසීඒ-4 |
| - | අත්තිකාරම් ගිණුම් | | 40,060,540 | 38,686,671 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | - | - | |
| - | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **2,486,476,496** | **1,873,238,345** | |
| - | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | **2,486,476,496** | **1,873,238,345** | |
| | **භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)** | | 152,895,178 | - | |
| | **ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)** | | 2,333,581,318 | 1,873,238,345 | |
| | **අඩු කළා : වියදම්** | | | | |
| - | **පුනරාවර්තන වියදම්** | | - | - | |
| 1,917,968,600 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රති | 5 | 1,886,427,151 | 1,509,647,546 | |
| 600,172,400 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 562,344,396 | 422,328,411 | ඒසීඒ-2(ii) |
| 7,554,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 5,525,465 | 10,921,552 | |
| - | පොළී ගෙවීම් | 8 | - | - | |
| - | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | - | - | |
| **2,525,695,000** | **මුළු පුනරාවර්තන වියදම් (ඊ)** | | **2,454,297,012** | **1,942,897,509** | |
| | **මූලධන වියදම්** | | | | |
| 109,500,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | 10 | 100,577,815 | 44,533,653 | |
| 469,500,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | 11 | 112,245,240 | 220,000 | |
| - | ප්‍රාග්ධන මාරුකිරීම් | 12 | - | 831,802 | ඒසීඒ-2(ii) |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | - | - | |
| 4,000,000 | හැකියා වර්ධනය | 14 | 2,842,580 | 2,114,204 | |
| 120,000,000 | වෙනත් මූලධන වියදම් | 15 | 11,514,267 | 3,027,423 | |
| **703,000,000** | **මුළු මූලධන වියදම් (උ)** | | **227,179,902** | **50,727,082** | |
| | තැන්පතු ගෙවීම් | | 20,412,046 | 9,008,298 | ඒසීඒ-4 |
| | අත්තිකාරම් ගෙවීම් | | 51,076,345 | 28,466,439 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | | - | - | |
| | **ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)** | | 71,488,391 | 37,474,737 | |
| **3,228,695,000** | **මුළු වියදම් එ = (ඊ+උ+ඌ)** | | 2,752,965,305 | 2,031,099,329 | |
| - | **දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)** | | (419,383,987) | (157,860,985) | |
| | **අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය** | | (420,937,456) | (157,860,985) | ඒසීඒ-7 |
| | **දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය** | | 1,553,469 | | ඒසීඒ-3 |
| | | | (419,383,987) | (157,860,985) | |

## 3.2 මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පී

**2024** දෙසැම්බර් **31** දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

| | සටහන | තත්‍ය 2024 රු. | 2023 රු. |
|---|---|---|---|
| <u>මූල්‍ය නොවන වත්කම්</u> | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 5,192,850,157 | 5,036,588,467 |
| <u>මූල්‍ය වත්කම්</u> | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(ඒ) | 108,960,672 | 97,944,867 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | 1,553,469 | - |
| මුළු වත්කම් | | **5,303,364,298** | **5,134,533,334** |
| <u>ශුද්ධ වත්කම් / ස්කන්ධය</u> | | | |
| භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් | | (110,758,984) | 89,484,664 |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 5,192,850,157 | 5,036,588,467 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසීඒ-5(බී) | | |
| <u>ජංගම වගකීම්</u> | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | 219,719,656 | 8,460,203 |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | 1,553,469 | - |
| මුළු වගකීම් | | **5,303,364,298** | **5,134,533,334** |

පිටු අංක..01.....සිට 57.... දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක .58.... සිට .97.... දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි **150** හා **151** සහ **2024.12.16** දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක **06/2024** විධිවිධානයන්ට අනුකූලව සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

| | | |
|---|---|---|
| ................................ | ................ | ................................................ |
| ප්‍රධාන ගණන්දීමේ නිලධාරි | ගණන්දීමේ නිලධාරි | ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්) |
| නම : | නම : | නම : |
| තනතුර : | තනතුර : | |
| දිනය : 2025.02.20. | දිනය : 2025.02.20 | දිනය : 2025.02.20 |

විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ
ලේකම්
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

වෛද්‍ය එම්.ඩී.ජේ. අබේගුණවර්ධන
ආයුර්වේද කොමසාරිස් ජනරාල්
ආයුර්වේද දෙපාර්තමේන්තුව
නාවින්න, මහරගම.

ඒ.එම්.එම්.කේ. අබේසිංහ
ප්‍රධාන ගණකාධිකාරි
ආයුර්වේද දෙපාර්තමේන්තුව
නාවින්න, මහරගම.

-05-

## 3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-සී

**2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**මුදල් ප්‍රවාහ ප්‍රකාශනය**

| | කතය | |
|---|---|---|
| | **2024** රු. | **2023** රු. |
| <u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| මුළු බදු ලැබීම් | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | - | - |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් | - | - |
| වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | 111,687,186 | 85,596,727 |
| අග්‍රිම ලැබීම් | 2,214,744,456 | 1,822,586,048 |
| අත්තිකාරම් අයකර ගැනීම් | 34,065,289 | 31,270,224 |
| තැන්පතු ලැබීම් | 231,671,500 | 11,965,626 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | **2,592,168,431** | **1,951,418,625** |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 2,271,118,326 | 1,785,604,263 |
| සහනාධාර සහ මාරුකිරීම් | 4,721,936 | 10,713,342 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | 8,679,692 | 107,705,942 |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | 152,895,178 | - |
| අත්තිකාරම් ගෙවීම් | 51,239,876 | 28,160,207 |
| තැන්පතු ගෙවීම් | 20,412,046 | 9,008,298 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | **2,509,067,054** | **1,941,192,052** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-(ආ)** | **83,101,377** | **10,226,573** |
| <u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| පොළී | - | - |
| ලාභාංශ | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | - | - |
| උපණය අයකර ගැනීම් | - | - |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)** | - | - |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | |
| ගැනීම් | 81,547,908 | 10,226,573 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | **81,547,908** | **10,226,573** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ( ඊ)=(ඈ)-(ඉ)** | **(81,547,908)** | **(10,226,573)** |
| **(උ)=( ඈ) + (ඊ)** | **1,553,469** | - |
| <u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | - | - |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)** | - | - |
| **මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)** | **1,553,469** | - |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | - | - |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | **1,553,469** | - |

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

නැත

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

| ආදායම් කේතය | ආදායම් කේතයේ විසතරය | ආදායම් ඇසතමේන්තුව | | එකතු කරන ලද ආදායම | |
|---|---|---|---|---|---|
| | | මුල් ඇසතමේන්තුව | අවසන් ඇසතමේන්තුව | ප්‍රමාණය (රු) | අවසාන ආදායම් ඇසතමේන්තු වේ % ප්‍රතිශතයක් ලෙස |
| 2002.01.01 | රජයේ ගොඩනැගිලි හා නිවාස කුලිය | 1,100,000.00 | 2,000,000.00 | 3,928,583.50 | 196% |
| 2002.02.99 | පොළිය | 7,000,000.00 | 3,000,000.00 | 3,310,950.35 | 110% |
| 2003.99.00 | අනෙතුක් ලැබීම් | 17,500,000.00 | 17,500,000.00 | 39,970,112.13 | 228% |
| 2006.02.02 | මූල්‍ය නොවන වත්කම් විකිණීමේ ආදායම | 30,000.00 | 90,000.00 | 86,412.00 | 96% |

**3.6** වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම (රු) | උපයෝගී කරනු ලබන ප්‍රතිපාදන අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදනය (රු) | අවසාන ප්‍රතිපාදනය (රු) | | |
| පුනරාවර්තන | 2,205,000,000.00 | 2,525,695,000.00 | 2,454,297,012.00 | 97% |
| ප්‍රාග්ධන | 700,000,000.00 | 703,000,000.00 | 227,179,902.00 | 32% |

**3.7** මු. රෙ. **208** ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

| අනු අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | තත්‍ය වියදම (රු) | මූල්‍ය ප්‍රගතිය % |
|---|---|---|---|---|---|---|
| | | | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| 01. | 020-1-1-7-1409(11) | 2024 සැප්තැම්බර් මස පැවති ජනාධිපතිවරණය වෙනුවෙන් මැතිවරණ රාජකාරි කටයුතු සඳහා සහභාගී වූ නිලධාරීන් සඳහා ගෙවීම. | 1,171,841,85 | 1,171,841,85 | 1,171,841,85 | 100% |
| 02. | 111-2-26-14-2509(13) | ලෝක සෞඛ්‍ය සංවිධානයෙන් අනුමත කර ඇති ව්‍යාපෘති සඳහා | 3,306,750.97 | 3,306,750.97 | 3,306,750.97 | 100% |
| 03. | 111-2-26-2-1409(11) | ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධන සෙවා කටයුතු | 3,369,500.00 | 3,369,500.00 | 1,642,467.27 | 48.75% |

**3.8** මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

| වත්කම් කේතය | කේත විසතර්ය | **2024.12.31** දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශෙෂය | **2024.12.31** දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශෙෂය | ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 2,287,707,621.66 | 2,287,707,621.06 | - | 100% |
| 9152 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 499,615,035.34 | 499,615,035.62 | - | 100% |
| 9153 | ඉඩම් | 2,405,527,500.00 | 2,405,527,500.00 | (තක්සෙරු වාර්තා ලද පසු) හම්බන්තොට වමල් රාජපක්ෂ රෝහල් ඉඩම සහ ත්‍රිකුණාමලයේ කෝනේෂපුරී සිද්ධ ශක්ෂණ රොහල් ඉඩම | 100% |
| 9160 | WIP | - | - | - | - |

## 3.9 විගණකාධිපති වාර්තාව

# ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | MED/A/AD/01/24/02 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2025 මැයි 22 දින |

ආයුර්වේද කොමසාරිස් ජනරාල්
ආයුර්වේද දෙපාර්තමේන්තුව

**ආයුර්වේද දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

ශීර්ෂය 220 -ආයුර්වේද දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ආයුර්වේද දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආයුර්වේද දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ පිටු අංක 05 හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.



අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34
+94 11 2 88 72 23
ag@auditorgeneral.gov.lk
www.naosl.gov.lk

## 1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාළ පිටු අංක 05 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව ආයුර්වේද දෙපාර්තමේන්තුවේ මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව ආයුර්වේද දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයන් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයින් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය නොවන වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) දෙපාර්තමේන්තුව නිත්‍යානුකූල අයිතිය පවරා ගෙන තිබුණු ඉඩම් 04 ක වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. තවද, සිගාස් පරිගණක මුද්‍රිත සටහන් ප්‍රකාරව ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද ශික්ෂණ රෝහලේ ඉඩමේ වටිනාකම වූ රු.53,000,000ක් දෙවරක් සටහන් කර තිබීම හේතුවෙන් ඉඩම්වල වටිනාකම එම අගයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) දෙපාර්තමේන්තුව සතු පිරිවැය රු.20,980,575ක්වූ උපකරණ 09ක් 2024 වර්ෂයේදී ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව වෙත භාර දී තිබුණද එම වත්කම්වල පිරිවැයෙන් රු.16,997,333ක් පමණක් මූල්‍ය නොවන වත්කම් වලින් ඉවත් කිරීමට කටයුතු කර තිබුණි.

(ඇ) දෙපාර්තමේන්තුවට අයිතිය නොමැති ඉඩම් 09 ක දෙපාර්තමේන්තුව විසින් ඉදිකර උපයෝජනය කරනු ලබන ගොඩනැගිලි 31ක වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ධාවන තත්ත්වයේ නොමැති කැබ් රථ 02 ක්, බස් රථයක් හා යතුරු පැදි 04ක් අපහරණ කටයුතු සඳහා 2022 පෙබරවාරි 14 දින සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත භාරදී තිබුණද, එම වත්කම්වල පිරිවැය හඳුනාගෙන මූල්‍ය නොවන වත්කම් වලින් ඉවත් කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ඉ) කල්බදු වාරික ගෙවීම් ක්‍රමය යටතේ 2012 වර්ෂයේදී මිලදී ගෙන තිබුණු පිරිවැය රු.8,400,000 ක් වූ වෑන් රථයක කල්බදු කාලසීමාවෙන් අනතුරුව දෙපාර්තමේන්තුව වෙත 2023 වර්ෂයේ පවරාගෙන තිබුණද, එම වාහනයේ පිරිවැය මූල්‍ය නොවන වත්කම් ලෙස සමාලෝචිත වර්ෂයේද ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

**1.6.2 විගණනය සඳහා සාක්ෂි නොවීම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එකතුව රු. 5,036,588,467ක්වූ දේපළ, පිරියත හා උපකරණ වලට අදාළ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තා විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) දෙපාර්තමේන්තුව සතුව රු.93,944,999 ක් වටිනා වාහන පවතින බව මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කර තිබුණද සිගාස් පරිගණක පද්ධතියේ එක් එක් වාහනය පිළිබඳ විස්තරාත්මක තොරතුරු සඳහන් කර නොතිබුණු බැවින් දෙපාර්තමේන්තුව සතු සියලු වාහනවල පිරිවැය මූල්‍ය ප්‍රකාශනවල නිරූපනය වන බවට තහවුරු කර ගැනීමට නොහැකි විය.

**1.6.3 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන හා පොත්පත් වර්ගය | | අදාළ රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|---|
| (අ) | හානි හා පාඩු ලේඛනය | මුදල් රෙගුලාසි 110 | යාවත්කාලීනකර නොතිබුණි. |
| (ආ) | බැරකම් පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 214 | පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| (ඇ) | චෙක්පත් භාරදීමේ ලේඛනය | මුදල් රෙගුලාසි 260,388 | යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| (ඈ) | ඇප තැන්පත් ලේඛනය | මුදල් රෙගුලාසි 891(1) | යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| (ඉ) | වාහන ලොග් පොත | මුදල් රෙගුලාසි 1645(අ) | යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි. |

## 2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වී තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| 2023 වර්ෂයේ ශීර්ෂය - 220 ට අදාළ 154(6) වාර්තාවේ ඡේද යොමුව | ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය | මෙම වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|
| 1.6.1 (ඈ)(vii) | අපහරණ කටයුතු කඩිනමින් අවසන් කළ යුතු අතර එම වත්කම්වල පිරිවැය හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශවලින් ඉවත් කිරීමට හා මූල්‍ය ප්‍රකාශනවල සටහන් මගින් තොරතුරු අනාවරණය කිරීමට කටයුතු කළ යුතුය. | 1.6.2 (ඈ) |
| 1.6.1 (ඈ) (viii) | මූල්‍ය නොවන වත්කම් ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. | 1.4.2 (ඉ) |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 අග්‍රිම කළමනාකරණය

සමාලෝචිත වර්ෂයේ අග්‍රිම සැලැස්ම අනුව භාණ්ඩාගාරයෙන් ඉල්ලුම් කරන ලද අග්‍රිම ප්‍රමාණය රු.2,701,111,550ක් වූ අතර භාණ්ඩාගාරයෙන් නිදහස් කළ ප්‍රමාණය රු.2,214,744,456ක් වූයෙන් අග්‍රිම කළමනාකරණය සැලසුම්කළ පරිදි ඉටු කර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

### 3.2 වියදම් කළමනාකරණය

මුදල් රෙගුලාසි 50 හි දැක්වෙන විධිවිධාන ප්‍රකාරව නිවැරදි හා තාත්වික ඇස්තමේන්තු පිළියෙල කර නොතිබුණු බව පහත දැක්වෙන කරුණු අනුව නිරීක්ෂණය විය.

(අ) අංක 220-1-1-0-1201 දරන වැය විෂයය සඳහා වෙන්කරන ලද රු.4,500,000ක මූලික ප්‍රතිපාදනයට අමතරව රු.3,000,000ක අමතර ප්‍රතිපාදන සපයා ගෙන තිබුණු අතර එම අමතර ප්‍රතිපාදනයෙන් රු.2,213,074ක් එනම් සියයට 73.76 ක ප්‍රතිපාදන ඉතිරිව තිබුණි.

(ආ) අංක 220-1-1-0-1302 දරන වැය විෂයය සඳහා වෙන්කරන ලද රු.1,500,000ක මුලික ප්‍රතිපාදනට අමතරව රු.1,400,000ක ප්‍රතිපාදන මාරුකර ගෙන තිබුණු අතර එම අමතර ප්‍රතිපාදනයෙන් රු.917,684ක් එනම් සියයට 65.54 ක ප්‍රතිපාදන ඉතිරිව තිබුණි.

(ඇ) අංක 220-2-2-13-2509 (සුවතා සංචාරක කටයුතු ප්‍රවර්ධනය) සහ අංක 220-2-5-0-2002 දරන වැය විෂයයන් දෙක සඳහා අනුමත කරන ලද පිළිවෙලින් රු.100,000,000ක හා රු.100,000ක මුළු ප්‍රතිපාදන මුදලම ඉතිරිවී තිබුණි.

(ඇ) පුනරාවර්ථන වැය විෂයයන් 18 ක් හා මූලධන වැය විෂයයන් 06 ක් වෙනුවෙන් අනුමත පිළිවෙලින් රු. 28,623,000 ක හා රු. 472,500,000 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් පිළිවෙලින් රු. 14,530,814 ක හා රු. 366,604,600 ක ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි. මෙම ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 26.41 සිට සියයට 91.45 දක්වා පරාසයක පැවතුණි.

### 3.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම

2025 වර්ෂයේදී ගෙවන ලද නමුත් 2024 දෙසැම්බර් මසට අදාළ ගෙවීම් වවුචර 05ක වටිනාකම වූ රු.807,844ක් බැරකම් ලෙස හඳුනාගෙන නොතිබුණි.

### 3.4 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ සඳහන් විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### 3.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති රීති විධිවිධානවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1947 අංක 16 දරන මහ නගර සභා ආඥා පනතේ 127 වගන්තිය | බොරැල්ල ආයුර්වේද ජාතික රෝහල ශික්ෂණ රෝහලක් බවට සංවර්ධනය කිරීමේ 02 වන අදියර යටතේ ඉදිකරන ලද මහල් 08 කින් යුතු නව ගොඩනැගිල්ලේ බිම් මහල ඇතුළුව මහල් 04 ක ඇඳන් 183කින් යුත් සමාන්‍ය වාට්ටු 05ක රෝගී සත්කාර සේවා ක්‍රියාත්මක කර තිබුණු නමුත් |

| | |
|---|---|
| | පනතේ විධිවිධාන ප්‍රකාරව අනුකූලතා සහතිකයක් ලබා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 758(1) | වාර්ෂික සමීක්ෂණයට අමතරව යටත් පිරිසෙකින් තෙමසකට වරක්වත් බඩු ලේඛන වවුචර සමඟ සසඳා බඩු ලේඛන පොත පරීක්ෂණ සෝදිසි වලට භාජනය කිරීමටද, තොග ශේෂයයන් සමඟ සසඳා ඇත්ත වශයෙන්ම තොගයෙහි ඇති භාණ්ඩ කිහිපයක් හරි වැරදි බැලීමද කලයුතු වුවත් ආයුර්වේද රෝහල්වල එකී විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ඇ) 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මගින් සංශෝධිත මුදල් රෙගුලාසි 756(6) | ආයුර්වේද රෝහල්වල තොග ගබඩා හා උපගබඩා සම්බන්ධයෙන් තොග ලේඛන ගත භාණ්ඩ පිළිබඳ වාර්ෂික සමීක්ෂණ ඉකුත් වර්ෂ ගණනාවක සිට සමාලෝචිත වර්ෂය දක්වාම සිදුකර නොතිබුණි. |
| (ඈ) 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය සහ 2017 අප්‍රේල් 19 දිනැති අංක 03/2017 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපිය | සියළුම රජයේ ආයතනවල ඇඟිලි සලකුණු සටහන් කිරීමේ යන්ත්‍ර භාවිතා කිරීම මගින් නිලධාරීන් කාර්යාලයට පැමිණීම හා පිටවීම සනාථ කිරීම සම්බන්ධයෙන් වාර්තා තබාගත යුතු බවට උපදෙස් හා විධිවිධාන නිකුත් කර ඇතත් ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතයකින් තොරව පැමිණීමේ ලේඛන පමණක් පදනම් කර ගනිමින් සමාලෝචිත වර්ෂයේදී ආයුර්වේද රෝහල් 11 ක නිලධාරීන් 1,614 දෙනෙකුට වැටුප්, අතිකාල හා නිවාඩු දින වැටුප් හා වෙනත් දීමනා ලෙස රු.94,450,328 ක් ගෙවා තිබුණි |

### 3.6 අවිධිමත් ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අයවැය අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක BD/HRD111/14/2022 දරන 2023 දෙසැම්බර් 07 දිනැති කොම්ප්ට්‍රෝලර් ජනරාල් අමතන ලද ලිපියේ 03 වන ඡේදයට අනුව රජයේ අමාත්‍යාංශ දෙපාර්තමේන්තු, පළාත් සභා හා ව්‍යවස්ථාපිත ආයතන අතර වත්කම් මාරු කිරීම හා පැවරීමේ දී අදාළ වත්කම්හි පොත්වල වටිනාකම හා තක්සේරු වටිනාකම අතර වෙනසක් ඇතොත් එය වත්කම මාරු කිරීම හා පැවරීම සිදු කරනු ලබන ආයතනය විසින් ගෙවිය යුතු බවට අවධාරණය කර තිබුණද, එයට පටහැනිව තක්සේරු කිරීමෙන් හා මුදල් අයකර ගැනීමකින් තොරව පිරිවැය රු.20,980,575ක්වූ උපකරණ 09ක් ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව වෙත භාර දී තිබුණි.

(ආ) 2024 අප්‍රේල් 08 දිනැති හා අංක 2379/02 දරන අති විශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව 2024 අප්‍රේල් 08 දින සිට ක්‍රියාත්මක වන පරිදි අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් ලෙස ආයුර්වේද ඖෂධ හා නිෂ්පාදන නියාමන සභාවක් පිහිටුවනු ලැබිය යුතු වුවද, එලෙස නියාමන සභාව ස්ථාපිත කර නොතිබුණි. එසේ වුවද, අධිකාරි බලයෙන් තොරව උක්ත ගැසට් පත්‍රයේ 4(ඉ) ප්‍රකාරව ස්ථාපිත කළ යුතු කමිටු 04න් "ආයුර්වේද ඖෂධ පිළිබඳ තාක්ෂණික කමිටුව" ආයුර්වේද දෙපාර්තමේන්තුව තුළ ස්ථාපිත කර තිබුණි. එසේම ආනයන/ අපනයන කාර්යයන් සඳහා එක්සත් ජනපද ඩොලර් වලින් ගාස්තු අය කළ යුතු වුවත්, ඊට පටහැනිව ශ්‍රී ලංකා රුපියල් වලින් ගාස්තු අයකර තිබුණි.

(ඇ) "පාරම්පරික වෛද්‍ය දැනුම සංරක්ෂණය කිරීමේ ව්‍යාපෘතියේ" ද්‍රව්‍ය ආශ්‍රිත ඒකකය ක්‍රියාකාරී මට්ටමක නොතිබියදී හා එම උපකරණ භාවිතයෙන් ඉවත් කළයුතු මට්ටමක තිබියදී එම පරිශ්‍රයේ රු.425,000ක වියදමක් දරා වායු සමීකරණ යන්ත්‍ර අලුත්වැඩියා කර තිබුණි.

### 3.7 තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීම හා පියවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අවශ්‍යතාවය නිසි පරිදි හඳුනාගැනීමෙන් තොරව නිලධාරීන් 15 දෙනෙකු විසින් අවස්ථා 30කදී ලබාගත් අත්තිකාරම් මුදලේ වටිනාකම රු.1,649,118ක්වූ අතර ඉන් රු.752,708ක අත්තිකාරම් වැය නොකර පියවා තිබුණි. මෙම ඉතිරිය ලබාගත් අත්තිකාරම් මුදලින් සියයට 32ත් සියයට 87ත් අතර පරාසයක විහිදී තිබුණි.

(ආ) 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මගින් සංශෝධිත,

(i) මුදල් රෙගුලාසි 371(5) ප්‍රකාරව අග්‍රිමයක් නිකුත් කිරීමෙන් පසු අදාළ කාර්යය අවසන් කර දින 10ක් තුළ එම අතුරු අග්‍රිමය නැවත පියවිය යුතු වුවත්, නිලධාරීන් 11 දෙනෙකු විසින් අවස්ථා 19කදී ලබාගත් අත්තිකාරම් මුදල පියවීමට දින 11ත් දින 44ත් අතර කාලයක් ගත කර තිබුණි.

(ii) මුදල් රෙගුලාසි 371(2)(ආ) ප්‍රකාරව කිසියම් විශේෂ කාර්යයක් සඳහා මාණ්ඩලික නිලධාරීන්ට එක් අවස්ථාවකදී රු.100,000ක උපරිමය දක්වා අත්තිකාරම් ලබාගත හැකි අතර එම කාර්යය නිමකළ විගස එම අත්තිකාරම පියවීමට කටයුතු කළයුතු වුවත්, නිලධාරීන් 04 දෙනෙකු අවස්ථා 05කදී රු.181,550ක් වටිනා අත්තිකාරම් ලබාගෙන තිබුණද ඉන් කිසිදු වියදම් දැරීමකින් තොරව මුදල් අත රඳවාගෙන සිට නැවත මුළු මුදලම පියවා තිබුණි.

(ඇ) 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබුණු රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුමේ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ආයතන සංග්‍රහයේ XLVIII වැනි පරිච්ඡේදයේ 21.3 වගන්තිය ප්‍රකාරව, වැඩ තහනමට ලක්වූ නිලධාරීන් සම්බන්ධයෙන් පැවැත්වෙන විනය පරීක්ෂණ කටයුතු හැකිතාක් අප්‍රමාදව අවසන් කිරීම අත්‍යාවශ්‍ය වුවද, 2020 වර්ෂයේ වැඩ තහනමට ලක් වූ එක් නිලධාරියෙකුගෙන් රු. 10,855 ක් ද, වර්ෂ 20 ක

කාලයක් ඉක්මවා තිබුණු නිලධාරීන් 03 දෙනෙකුගෙන් රු. 87,610 ක් ද, අයකර ගැනීමට අපොහොසත්වී තිබුණි.

(ii) ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 4.2.4 වගන්තියේ සඳහන් විධිවිධාන ප්‍රකාරව නිලධාරියෙකු විශ්‍රාම ගැනීමට නියමිතව ඇති කල්හි ඔහුගෙන් අයවිය යුතු සියළුම ණය පිළිබඳ විස්තර විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතු අතර, 4.2.5 වගන්තිය ප්‍රකාරව නිලධාරියාගේ පරිවර්තිත විශ්‍රාම වැටුපෙන් හෝ පාරිතෝෂික මුදල් වලින් හෝ අයකර ගත යුතුය. නමුත් 2024 දෙසැම්බර් 31 දිනට විශ්‍රාමගොස් වසර 02ක් ඉක්ම වූ නිලධාරීන් 03 දෙනෙකුගෙන් අයවිය යුතු රු.253,200 ක්ද, වසර 06කට වඩා පැරණි විශ්‍රාම ගිය නිලධාරින් දෙදෙනෙකුගෙන් අයවිය යුතු රු.181,160ක්ද , වසර 20 කට වඩා පැරණි විශ්‍රාම ගිය නිලධාරීන් 03 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 52,050 ක්ද විය.

(iii) 2019 ජුනි 27 දිනැති අංක 05/2019 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3(ඉ)(ii) ප්‍රකාරව සේවය හැර ගිය නමුත් නැවත සේවයේ පිහිටුවා නොතිබුණු නිලධාරීන්ගේ ජාතික හැඳුනුම්පත් අංකය මැතිවරණ කොමසාරිස් වෙත ඉදිරිපත් කර පදිංචිය පිළිබඳව විස්තර විමසා ප්‍රාදේශීය ලේකම් මගින් එම නිලධාරීන්ගේ වත්කම් පිළිබඳව තහවුරුවක් ලබා ගැනීමෙන් අනතුරුව නීතිපති මගින් ණය මුදල අයකර ගත යුතු වුවද, 2024 දෙසැම්බර් 31 දින වන විට සේවය හැරගිය වර්ෂ 01ක් වර්ෂ 03ක් අතර කාලයක් ගතවී තිබුණු නිලධාරින් 06 දෙනෙකුගෙන් රු. 261,176ක්ද, වර්ෂ 05ක් වර්ෂ 10ක් අතර කාලයක් ගත වී තිබුණු නිලධාරීන් 06 දෙනෙකුගෙන් රු. 502,630ක්ද ,වර්ෂ 20ක් ඉක්මවා තිබුණු නිලධාරින් 10 දෙනෙකුගෙන් රු. 259,480ක්ද, අයකර ගෙන නොතිබුණි.

(iv) ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.5, 4.6 හා 6.3 වගන්තිය හා 2019 ජුනි 27 දිනැති අංක 05/2019 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛනයෙහි 03 (ආ) ඡේදය, 2017 දෙසැම්බර් 29 දිනැති අංක 262/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛනයෙහි 04 ඡේදය ප්‍රකාරව මියගිය නිලධාරීන්ගේ ණය ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වුවත්, මියගොස් 2024 දෙසැම්බර් 31 දිනට මාස 06 කට වැඩි කාලයක් ගතවී තිබුණු නිලධාරීන් 09 දෙනෙකුගෙන් අයවිය යුතු මුළු ණය ශේෂය රු616,040 ක් විය. එම ණය ශේෂ අතරින් රු. 112,250ක් වසර 20කට පෙර මිය ගිය නිලධාරීන් දෙදෙනෙකුටද, රු. 17,850 ක් වසර 10කට පෙර මිය ගිය නිලධාරීන් දෙදෙනෙකුටද, රු. 154,200ක් වසර 01ත් 05ත් අතර කාලයකට පෙර මිය ගිය නිලධාරීන් දෙදෙනෙකුට හා රු.2,500 ක් මාස 06 ඉක්මවූ එක් නිලධාරියකුට අදාළ ණය ශේෂ විය.

(v) අංක 05/2019 හා 2019 ජුනි 27 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුම යටතේ ස්ථාන මාරු වීම් යන / එන නිලධාරීන්ට අදාළ ණය ශේෂ, ණය මුදල් ගෙවා අවසන් වීමට පෙර විශ්‍රාම ගොස් සිටින හා මියගොස් ඇති සේවකයින්ගේ ණය ශේෂ, ණය මුදල් ගෙවා අවසන් වීමට ප්‍රථම සේවයෙන් මුදා හරින ලද සේවකයන්ට අදාළ ණය ශේෂ

හා කල්ගත වූ ණයශේෂ අයකර ගැනීමට හා නිරවුල් කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**3.8 තැන්පතු**

තෙවන පාර්ශවයන් වෙත ආපසු ගෙවීමට යටත්ව තාවකාලිකව රඳවා ගන්නා ලද කේවල ශේෂ ලැයිස්තුවෙහි තැන්පත්කරුගේ/ ආයතනයේ නම හඳුනාගත හැකි ආකාරයට පවත්වාගෙන ගොස් නොතිබුණු අවස්ථා 26ක් වූ අතර එහි වටිනාකම රු.1,488,160ක් විය.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යය සාධනය**

**4.1.1 කාර්යයභාරයන් ඉටු නොකිරීම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන 2001 වර්ෂයේ සිට 2005 වර්ෂය දක්වා නියමු ව්‍යාපෘතියක් ලෙස අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කර එහි සාර්ථකත්වය අනුව 2005 වර්ෂයේ සිට අනෙකුත් දිස්ත්‍රික්ක සඳහා සේවා ව්‍යාප්ත කළ යුතු වුවද, අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ පමණක් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා 2005 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා රු.මිලියන 877.2 ක් වැය කර තිබුණි. නමුත් 2022 වර්ෂයේ සිට වෙනම එම ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන සලසා නොගෙන සංවර්ධන වැඩසටහනේ රෝගී ප්‍රතිකාර සේවා ව්‍යාපෘතිය යටතේ වැටුප්, දීමනා, ගිවිසුම්ගත සේවා ඇතුළු පුනරාවර්තන වියදම් සඳහා පමණක් ප්‍රතිපාදන සලසා ගෙන සමාලෝචිත වර්ෂයේ නිලධාරීන් 205දෙනෙකුට වැටුප් දීමනා හා අනෙකුත් වියදම් සඳහා රු.මිලියන 173.7ක් වැයකර තිබුණි. ඒ අනුව අනෙකුත් දිස්ත්‍රික්ක ආවරණය කරමින් ව්‍යාප්ත කිරීමට තරම් සාර්ථකත්ව ක්‍රියාත්මක නොවූ මෙම ව්‍යාපෘතියට අදාළ පුනරාවර්තන වියදම් පමණක් දෙපාර්තමේන්තුවේ වැය විෂයයන් මගින් ආවරණය කරමින් ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන තව දුරටත් පවත්වාගෙන යාමට කටයුතු කිරීම මතභේදයට තුඩුදෙන කරුණකි.

(ආ) ආයුර්වේද දෙපාර්තමේන්තුව හා එහි අනුබද්ධ ආයතන, රෝහල්, වෛද්‍ය මධ්‍යස්ථාන ඇතුළු සම්පූර්ණ ආයතන පද්ධතියම ඇතුළත්වන පරිදි කළමනාකරණ තොරතුරු පද්ධතියක් (MIS) සැකසීම සඳහා 2021 වර්ෂයේ මෙන්ම 2022 වර්ෂයේදීද රු.මිලියන 25 බැගින් ප්‍රතිපාදන සලසාගෙන තිබුණු නමුත් එම කාර්යය සමාලෝචිත වර්ෂයේදීද ඉටුකර නොතිබුණි.

(ඇ) ආයුර්වේද දෙපාර්තමේන්තුවේ සමාලෝචිත වර්ෂයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම මගින් ශාරීරික සුවතා මධ්‍යස්ථාන ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 100ක ප්‍රතිපාදන වෙන්කරවා ගෙන තිබුණද එම කාර්යය ඉටු කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනයෙහි නේවාසිකාගාරයේ පහසුකම් වැඩිදියුණු කිරීම, දේශනශාලා ප්‍රායෝගික පරීක්ෂණ ශාලා වැඩිදියුණු කිරීම, පුස්තකාලය හා ගොඩනැගිල්ල වැඩි දියුණු කිරීම යන කාර්යයන් සඳහා රුපියල් මිලියන 04ක ප්‍රතිපාදන වෙන්කරවා ගෙන තිබුණද, රුපියල්

මිලියන 4.68ක් වැය කර ආයතනයේ නේවාසිකාගාර පහසුකම් වැඩිදියුණු කිරීම පමණක් සිදුකර තිබුණි.

### 4.1.2 ප්‍රධාන කාර්යයන්ට පටහැනි ක්‍රියාකාරකම්

බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ හා සංස්කෘතික දෙපාර්තමේන්තුවේ අරමුණු යටතට ගැනෙන කාර්යයක්වූ හිසතෙල් ගෑමේ රාජ්‍ය උත්සවයට සමගාමීව මෙම කාර්යය සඳහා ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් රු.4,910,611ක් වැය කර තිබුණි.

## 4.2 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2020 අගෝස්තු 28 දිනැති හා 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රවර්ථන වර්ෂයේ දෙසැම්බර් 10 දිනට පෙර සකස් කොට ඒ සඳහා ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අනුමැතිය ලබාගෙන එහි පිටපත් විගණකාධිපති වෙත එවිය යුතු වුවත් සමාලෝචිත වර්ෂයේදීත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ආ) වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම හා සංශෝධිත ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අනුමැතිය ලබා නොතිබුණි.

(ඇ) 2024 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මෙහි ජාතික තරඟකාරී මිල සැදැහුම් ක්‍රමය යටතේ කාර්යාලීය ගෘහභාණ්ඩ මිලදී ගැනීමට තීරණය කර තිබුණද, නිසි අනුමැතියකින් තොරව වෙළඳපල මිල සැදැහුම් ක්‍රමය යටතේ මිලදී ගැනීමට කටයුතු කර තිබුණි. මෙහිදී,

(i) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.6.1(v) ප්‍රකාරව කටයුතු කිරීමෙන් තොරව තාක්ෂණික පිරිවිතරයන්ට අනුකූලතාවය දක්වා ඇති ලංසුකරුවන් දෙදෙනාගෙන් රු.3,174,200ක් වූ අවම ලංසුව ඉදිරිපත් කරන ලද ආයතනය සතුව නිම කරන ලද භාණ්ඩ නොමැති බවට දුරකථනයෙන් ලබා ගන්නා ලද තොරතුරු මත පදනම්ව තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් මෙම ලංසුව ප්‍රතික්ෂේප කර තිබුණි.

(ii) තාක්ෂණික පිරිවිතරයන්ට අනුව සියලුම භාණ්ඩ සඳහා වසර 03ක වගකීම් කාලයක් අවශ්‍ය බව දක්වා තිබියදී, වසරක හා වසර 02 ක වගකීම් කාලයක් සහිත ආයතන 02 ක් වෙතින් රු. 6,062,494 ක් වූ කාර්යාලීය ගෘහභාණ්ඩ මිලදී ගැනීමට කටයුතු කර තිබුණි.

(iii) තාක්ෂණික පිරිවිතරයන්ට අනුව වසර 03ක වගකීම් කාලයක් තිබිය යුතු වුවත් වසරක වගකීම් කාලයක් සහිත හා ලංසු ලේඛන ප්‍රකාරව වානේ ඝණත්වය මි.මී. 0.8 - මි.මී. 0.7ක්වූ Workmen Locker සැපයිය යුතු වුවත් සැපයීමේදී වානේ ඝණත්වය මි.මී. 0.6ක්වූ අඩු වානේ ඝණත්වය සහිත Workmen Locker සපයා තිබුණි.

(ඇ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට පටහැනිව මිල කැඳවීමකින් තොරව ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත සෘජුව ආයුර්වේද දෙපාර්තමේන්තු කාර්යාල ගොඩනැගිල්ලේ වහලය අලුත්වැඩියා කිරීමට ලබා දී තිබුණි. මෙම අලුත්වැඩියාව සඳහා සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය රු.44,900,000ක ප්‍රතිපාදන ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත වෙන් කරවා දී තිබුණි. මෙහිදී,

(i) නෛතික ගිවිසුමකින් තොරව රුපියල් මිලියන 44.9ක්වූ උක්ත කාර්යය ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත පවරා තිබුණි.

(ii) ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් උක්ත කාර්ය සිදු කරවා ගැනීමට උප කොන්ත්‍රාත් පිරිනමා තිබුණද, ඊට අදාළ ගිවිසුමෙහි පිටපත් ආයුර්වේද දෙපාර්තමේන්තුව සතු නොවූයෙන් ගිවිසුමේ කොන්දේසි, නිමකළ යුතු දිනය, කාල ප්‍රමාදයන් සඳහා අයකිරීම්, හානි පූරණයන් සම්බන්ධ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවිය.

(iii) අදාළ පරිශ්‍රයේ භාණ්ඩවල ආරක්ෂාව තහවුරු කර වහල අලුත්වැඩියා කාර්ය සඳහා ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ උප කොන්ත්‍රාත් සමාගම වෙත පිරිනැමීම සිදුකළ යුතු වුවද, එසේ නොකිරීම හේතුවෙන් වැසි ජලය වැටීමෙන් රු.1,124,708ක්වූ ගෘහ භාණ්ඩ හා උපකරණ නැවත භාවිතයට ගත නොහැකි තත්ත්වයට පත්ව තිබුණි. උප කොන්ත්‍රාත් සමාගම විසින් මෙම අලාභ මුදල ගෙවනු නොලබන බැවින්, මුදල් රෙගුලාසි 104 (2) "ආ"පරිදි නෛතික ගිවිසුමකට එළඹීමට කටයුතු නොකළ හා අදාළ භාණ්ඩවල ආරක්ෂාව තහවුරු නොකළ සියලුම නිලධාරීන් වෙතින් අධිභාර කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට පටහැනිව මිල කැඳවීමකින් තොරව ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව වෙතින් පමණක් ඖෂධ මිලදී ගනු ලබන බව නිරීක්ෂණය විය. 2023 වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේදී පමණක් පිළිවෙලින් රු.53,731,570ක් හා රු.126,583,034ක් වටිනා ඖෂධ මිලදී ගෙන තිබුණි. 2023 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මිලදී ගැනීමේ පිරිවැය සියයට 136ක ප්‍රතිශතයකින් ඉහල ගොස් තිබුණි.

## 4.3 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අවශ්‍යතාවය නිසියාකාරව හඳුනා ගැනීමෙන් තොරව දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගබඩාව විසින් මිලදී ගැනීම හේතුවෙන් රසායන ද්‍රව්‍ය, පොලිතින්, වියලි ඖෂධ ද්‍රව්‍ය අයිතම 05 කට අදාළව ලීටර් 217ක්, අයිතම 07 කට අදාළව ඒකක 5,043 ක් හා අයිතම 18 කට අදාළව කිලෝග්‍රෑම් 312 ක් හා අයිතම 44 කට අදාළව පොත් ඒකක 13,598ක තොග චලනය නොවන හා ඉතා සෙමෙන් චලනය වන්නාවූ තත්ත්වයේ පැවතුණි.

(ආ) විධිමත් නිකුතු නියෝග ලබා දීමෙන් තොරව වාචික උපදෙස් මත ගබඩා භාරකරු විසින් 2019 වසරේ සිට 2024 ජුනි 20 දින දක්වා වූ කාලය තුළ පොත් ගබඩාවෙන් අවස්ථා 27කට අදාළව පොත් ඒකක 4,252ක් නිකුත් කර තිබුණි.

(ඈ) බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණායතනය විසින් 2015 වර්ෂයේදී රු.23,557,179ක් වැය කර මිලදී ගන්නා ලද ද්‍රව්‍ය දෘශ්‍ය උපකරණ වර්ග 38 කට අදාළව ඒකක 97 ක් නිශ්කාර්යව පැවතුණි.

(ඇ) ආයුර්වේද පර්යේෂණ රෝහල්, ශික්ෂණ රෝහල්, සංචාරක නිවාස හා ඔසු උයන් විසින් නිවැරදිව, තොග පොත් / ලේඛන / ඉන්වෙන්ට්‍රි පොත් යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණු අතර පරිත්‍යාග පිළිබඳ තොරතුරු ප්‍රධාන කාර්යාලය වෙත වාර්තා නොකිරීම හේතුවෙන් ප්‍රධාන කාර්යාලීය ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන යාමට නොහැකි වී තිබුණි.

(ඉ) නාවින්න බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණායතනයේ, ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද ශික්ෂණ රෝහලේ හා පල්ලේකැලේ පර්යේෂණ හා ව්‍යාප්ත සේවා ඔසු උයනෙහි ඉතා වටිනා ශාක හා දුර්ලභ ඖෂධීය ශාක පිළිවෙලින් 49ක්, 05ක් හා 05ක් නිසි අනුමැතියකින් තොරව කපා ඉවත් කර තිබුණි.

### 4.4 රජයේ නිලධාරීන් ඇප තැබීම

මුදල් රෙගුලාසි 892 ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන්ගේ සංශෝධිත වාර්තාවක් සෑම වර්ෂ 03 ක් අවසානයට පසුව යෙදෙන පෙබරවාරි 15 දිනට ප්‍රථම අදාළ අමාත්‍යාංශයේ ලේකම් හා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. මෙම වාර්තාව සමඟ තවදුරටත් ඇප තැබීමට අවශ්‍ය නොවන නිලධාරීන්ගේ නම්ද, ඇතුළත් විස්තරාත්මක වාර්තාවක් යැවීමට කටයුතු කළ යුතු වුවත් එලෙස ක්‍රියා කර නොතිබුණි.

### 4.5 මූල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගනුදෙනු

"AyurEx Colombo 2023" නමින් දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණයක් හා අධ්‍යාපන වෙළඳ ප්‍රදර්ශනය සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149(1) ව්‍යවස්ථාවන්ට හා මුදල් රෙගුලාසි 132,170(2) ප්‍රකාරව කටයුතු නොකර ආයුර්වේද කොමසාරිස්වරයාගේ නිලනාමය භාවිතා කරමින් බාහිර පාර්ශව වෙතින් පරිත්‍යාග ලබා ගැනීමට ලිපි යවමින් සුභ සාධක සංගමයේ බැංකු ගිණුමට මුදල් බැර කිරීමට උපදෙස් දී තිබුණි. මෙහිදී, පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතනවලින් රු.28,469,950ක මුදලක් එකතු කරගෙන එම මුදල් දෙපාර්තමේන්තු සුභ සාධක සංගමයේ ගිණුමකට බැර කර ගෙන එම මුදලින් රු.28,326,935ක් වියදම් දරා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව මිල ගණන් කැඳවීමකින් තොරව සුභසාධක සංගමය විසින් ආයුර්වේද කොමසාරිස්වරයාගේ යෝජනාවක් අනුව රු.28,945,285 ක වියදමින් මෙම ප්‍රදර්ශනය කළමනාකරණය කිරීම සඳහා මහනුවර පිළිමතලාව ප්‍රදේශයේ පුද්ගලික සමාගමක් ඉසව් කළමනාකරණ ආයතනය ලෙස තෝරා ගෙන තිබුණි. මෙම ගිවිසුමට එළඹෙන විට සුභසාධක සංගම් ගිණුමේ රු.836,948ක් පමණක් පැවතීම මතභේදයට තුඩුදෙන කරුණකි.

(ඇ) ඉසව් කළමනාකරණ ආයතනයට චෙක්පත් වලින් සෘජුවම මුදල් ගෙවීමට හැකියාව තිබියදී අවස්ථා 03කදී ආයුර්වේද කොමසාරිස් ජනරාල්වරයාගේ වාචික හා ලිඛිත උපදෙස්මත රු.10,881,642 ක් බැංකුවෙන් මුදල් ලබාගෙන අදාළ ආයතනයේ ගිණුමට තැන්පත් කර තිබුණි.

(ඇ) සුහසාධක සංගමය විසින් රු.1,820,430ක් සත්‍ය වශයෙන්ම වැයකළ බව සනාථ කිරීම සඳහා වූ ලේඛන කිසිවක් විගණනයට ඉදිරිපත් කිරීමට හැකිව නොතිබුණි.

(ඉ) 2023 සැප්තැම්බර් මස 10 දින මෙම ප්‍රදර්ශනය පවත්වා නිම වුවද, 2023 දෙසැම්බර් 01 දින පුද්ගලික ආයතනයක් විසින් රු.110,000ක මුදලක් සුහසාධක සංගමය වෙත ලබාදී තිබුණි.

(ඊ) 2024 අප්‍රේල් 01 දින රු.422,000ක්, 2024 අප්‍රේල් 30 දින රු.474,000ක්, 2024 මැයි 05 දින රු.11,000ක් වශයෙන් එකතුව රු.907,000ක මුදලක් බාහිර පාර්ශවයන් විසින් සුහසාධක සංගමයේ ජංගම ගිණුමට බැර කර තිබුණු බව සංගමයේ මුදල් පොත අනුව අනාවරණය විය. ඊට අදාළ තොරතුරු සුහසාධක සංගමය සතු නොවූ අතර ආයුර්වේද කොමසාරිස්වරයාගේ වාචික උපදෙස් මත 2024 අප්‍රේල් 24 දින හා 2024 මැයි 02 දින මුදල් චෙක්පත් මඟින් පුද්ගලයෙකු හට රු.896,000ක් ගෙවා තිබුණු අතර එම ගෙවීමට අදාළ තොරතුරු සුහසාධක සංගමය සතු නොවීය. මේ අනුව කොමසාරිස් ජනරාල්වරයා විසින් සුහසාධක සංගමයට අයත් නොවූ කාර්යයන් වෙනුවෙන් අවිධිමත් ආකාරයෙන් මුදල් රැස්කිරීමට හා වියදම් කිරීම සඳහා මෙම සුහසාධක සංගම් ගිණුම භාවිතා කර තිබුණි.

## 4.6 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයුර්වේද දෙපාර්තමේන්තුව සතුව හෙක්ටයාර 190ක්වූ පර්යේෂණ හා ව්‍යාප්ති සේවා ඔසු උයන් 07ක් පැවතියද, සමාලෝචිත වර්ෂයේදී ඔසු උයන් 03කින් කිසිදු ඖෂධීය අමුද්‍රව්‍යයක් සපයා නොතිබූ අතර ඔසු උයන් 04කින් ඖෂධීය අමුද්‍රව්‍ය කිලෝග්‍රෑම් 906.4ක් පමණක් සපයා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ආයුර්වේද ශික්ෂණ රෝහල් 04ක් හා පර්යේෂණ රෝහල් 07කින් ඖෂධ නිෂ්පාදන ලීටර් 252,892ක් හා ඖෂධ කිලෝග්‍රෑම් 11,846ක ඖෂධ පමණක් නිෂ්පාදනය කර තිබුණි. ඒ අනුව ඖෂධ නිෂ්පාදනය හා ඔසු උයන් මඟින් ඖෂධ සැපයීම අවම මට්ටමක පවතී.

(ඇ) ආයුර්වේද දෙපාර්තමේන්තුව සතුව රු.422,500 ක් වටිනා ඇඟිලි සලකුණු යන්ත්‍ර 19 ක් තිබුණද ඉන් යන්ත්‍ර 14 ක් ඌන උපයෝජිතව පැවති අතර යන්ත්‍ර 03 ක් අක්‍රිය තත්වයේ පැවතුණි.

(ඈ) බොරැල්ල ආයුර්වේද ජාතික රෝහලේ 05 වන මහලේ කොළඹ විශ්ව විද්‍යාලය යටතේ පාලනය වන දේශීය වෛද්‍ය පශ්චාත් උපාධි ආයතනය 2017 ජුනි 02 සිට ස්ථාපිත කර තිබුණද සමාලෝචිත වර්ෂයේදී ද ඒ සඳහා විධිමත් ගිවිසුමකට එළඹ නොතිබුණු අතර මාසික කුලියක්ද අයකර ගෙන නොතිබුණි.

(ඉ) බොරැල්ල ආයුර්වේද ජාතික රෝහල් පරිශ්‍රයේ බොහෝ ස්ථානවල මුද්‍රිත ආකෘති පත්‍ර අනාරක්ෂිතව හා අවිධිමත් ආකාරයෙන් ගබඩා කර තිබුණු අතර තොග ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. වර්ෂ ගණනාවක සිට භාවිතයට නොගන්නාවූ මෙම ආකෘති පත් එසේ අනාරක්ෂිතව තිබීම හේතුවෙන් වේයන් වැනි කෘමි සතුන්ගෙන් හා දූවිලි බැඳීමෙන් හානි සිදුව තිබුණද සමාලෝචිත වර්ෂයේදී ද ඒ සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඊ) අම්පාර සිරිමාවෝ බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණ රෝහලේ, හා දෛනික නේවාසික රෝගීන් සංඛ්‍යාව උපරිම ලෙස 02ක් වුවද, සේවයේ අවශ්‍යතාවය

ඉක්මවා උපස්ථායකයින් 10ක් හා ආයුර්වේද සේවා සහයකයින් 21ක් සේවයේ යොදවීමෙන් පිසූ ආහාර සඳහා 2023 වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේ පමණක් පිළිවෙලින් රු. 1,712,098ක් හා රු. 1,389,029ක් වැය කර තිබුණි. එසේම, අතිකාල සඳහා දරන ලද වියදම 2023 වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේ පමණක් පිළිවෙලින් රු.2,749,240 ක් හා රු.3,288,535 විය.

(උ) මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය නොවන වත්කම් යටතේ දක්වා තිබුණු වටිනාකම වූ රු. 613,832,500 ක්වූ ඉඩම් 07 ක හා දෙපාර්තමේන්තුව විසින් උපයෝජනය කරන හෙක්ටයාර 52.7958 ක්වූ ඉඩම් 08ක අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඌ) මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය නොවන වත්කම් යටතේ දක්වා තිබුණු වටිනාකම රු.431,585,212 ක්වූ ගොඩනැගිලි පිහිටි ඉඩම් 09ක අයිතිය දෙපාර්තමේන්තුවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(එ) අනුරාධපුර ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධන ව්‍යාපෘතියේ භාවිතය සඳහා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය ලබාදී තිබුණු ධාවනයෙන් ඉවත් කර ඇති යතුරු පැදි 20ක් අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ නැවත අමාත්‍යාංශය වෙත භාරදීමට හෝ කටයුතු කර නොතිබුණි.

## 5. තිරසාර සංවර්ධනය

2017 අංක 19 දරන තිරසාර සංවර්ධන පනතේ 3.6, 3.9, 11 හා 11.2 වගන්ති ප්‍රකාරව, ආයතනයේ අරමුණු ළඟාකර ගැනීම උදෙසා සිය සම්පත් කාර්යක්ෂමව මෙහෙයවිය යුතු අතර තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම පිණිස ආයතනය විසින් සපුරාගත යුතු ඉලක්කයන් හා එම ඉලක්කයන් සපුරා ගැනීම සඳහා පවතින පරතරයන්ද, ප්‍රගතිය මැන බැලීම සඳහා සුදුසු දර්ශකයන්ද හඳුනාගත යුතුය. නමුත් දෙපාර්තමේන්තුව විසින් එවැනි දර්ශකයන් හඳුනාගෙන අරමුණුවලින් ළඟාකරගත් ප්‍රමාණය හා බැහැරවීම් මෙන්ම අවධානය යොමු කළ යුතු විවිධ ක්ෂේත්‍රයන් හඳුනාගෙන නොතිබුණි.

## 6. යහපාලනය

### 6.1 මහජනයා වෙත සේවා ඉටු කිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ මංචන්තොඩුවායි, මැදවච්චිය, අම්පාර, හම්බන්තොට හා නාවින්න යන ආයුර්වේද පර්යේෂණ රෝහල් 05හි ප්‍රතිකාර ලබා තිබුණු දෛනික නේවාසික රෝගීන් සංඛ්‍යාව අවම මට්ටමක පැවැති අතර එම රෝහල් 05ට අදාළව වාට්ටු 12ක රෝගී ඇඳන් 246ක් පමණ ඌන උපයෝජිතව තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී ද බොරැල්ල ආයුර්වේද ජාතික රෝහලේ නව අටමහල් ගොඩනැගිල්ලේ සාමාන්‍ය වාට්ටු ඇඳන් 288ක ධාරිතාවයෙන් 120ක් හෙවත් සියයට 42ක්ද, රෝහලේ පැරණි සාමාන්‍ය වාට්ටුවල ඇඳන් 274කින් 76ක් හෙවත් සියයට 28ක්ද ඌන උපයෝජිතව පැවැති බවද නවගොඩනැගිල්ලේ නවීන කාමර පහසුකම් වලින් සමන්විත ඇඳන් 88ක ධාරිතාවයෙන් යුක්ත ගෙවන වාට්ටු සියල්ලම සහ පැරණි ගෙවන වාට්ටු 32කින් 08ක් ඌන උපයෝජිතව පැවතීම හේතුවෙන් රෝගී සත්කාර සේවා නිසි පරිදි ඉටු කර නොතිබුණි.

(ඇ) පාරම්පරික වෛද්‍ය ක්‍රම, බෝ නොවන රෝග නිවාරණ, යුනානි ආයුර්වේද, වකුගඩු රෝග, ආයුර්වේද සාහිත්‍ය, ආයුර්වේද මූලධර්ම, ආයුර්වේද චිකිස්සාව හා ආයුර්වේද

ඖෂධ පිළිබඳ පර්යේෂණයන් සිදු කිරීම සඳහා ආයුර්වේද පර්යේෂණ රෝහල් 07 ක් ස්ථාපිත කර තිබුණද, නාවින්න ආයුර්වේද පර්යේෂණායතනයේ හැර සියළුම පර්යේෂණ රෝහල්වල ආයුර්වේද පර්යේෂණ වාර්තා, ප්‍රකාශන හෝ නව ඖෂධ හඳුන්වා දීමක් සිදු කර නොතිබුණි.

7. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දෙපාර්තමේන්තුව සඳහා කළමනාකරණ දත්ත පද්ධතියක් සකස් කර ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණද සමාලෝචිත වර්ෂයේද අදාළ දත්ත පද්ධතිය ස්ථාපිත කර නොතිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව හා එහි අනුබද්ධ ආයතන, රෝහල්, වෛද්‍ය මධ්‍යස්ථාන ඇතුළු සම්පූර්ණ ආයතන පද්ධතියට අදාළ යාවත්කාලීන කළමනාකරණ තොරතුරු කාර්යක්ෂමව ලබා ගැනීමට අපහසුව පැවැති අතර දෙපාර්තමේන්තුවේ කාර්යමණ්ඩල පැමිණීම හා පිටවීම සටහන් කිරීමේ පාලනය, කාර්යසාධන පාලනය, වැටුප් පාලනය, අතිකාල වියදම් පාලනය, පුද්ගලික ලිපිගොනු පාලනය යනාදී පාලනයන් දුර්වල මට්ටමක තිබුණි.

(ආ) 2024 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය 2,393ක් වුවද, එදිනට තථ්‍ය කාර්ය මණ්ඩලය 1,614ක් වුයෙන් අනුමත කාර්ය මණ්ඩලයෙන් සියයට 30කට සමාන පුරප්පාඩු 725ක් විය. තවද මෙම පුරප්පාඩු තුළ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 132ක්ද තෘතියික මට්ටමේ පුරප්පාඩු 35ක්, ද්විතීයික මට්ටමේ පුරප්පාඩු 322ක් හා ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 236ක් පැවතීම හේතුවෙන් දෙපාර්තමේන්තුවේ හා ආයුර්වේද රෝහල්වල කාර්ය සාධනයට දැඩි බලපෑමක් සිදු වී තිබුණි.

(ඇ) ආයුර්වේද පර්යේෂණ රෝහල් 06 ක් සඳහා පර්යේෂණ කාර්යය මණ්ඩලයක් අනුමත කරගෙන නොතිබුණු අතර බණ්ඩාරනායක අනුස්මරණ පර්යේෂණ ආයතනය සඳහා එක් එක් විෂය ක්ෂේත්‍රයට අදාළව පර්යේෂණ නිලධාරි තනතුරු 18 ක් හා පර්යේෂණ සහායක තනතුරු 12 ක් අනුමත කරගෙන තිබුණද, ඉන් කිසිවෙකු බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) මෛත්‍රිපාල සේනානායක අනුස්මරණ පාරම්පරික ආයුර්වේද පර්යේෂණ රෝහලේ අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා සේවා අවශ්‍යතාවයක් නොමැතිව ටීකට් ලිපිකරුවෙකු හා ඖෂධ සංයෝජකවරයෙකු අනුයුක්ත කර තිබුණු අතර දිනකට පැමිණෙන රෝගීන්ගේ සාමාන්‍යය ගත් කළ රෝගීන් 10ක් වුවත්, වෛද්‍යවරු තිදෙනෙකු අනුයුක්ත කර තිබුණි.

(ඉ) තින්දවූර් ආයුර්වේද පර්යේෂණ රෝහලේ ඖෂධවේදී තනතුර රෝහල ආරම්භයේ සිට පුරප්පාඩුව පැවතුණි.

බී.ජී. දර්ශන
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය
බත්තරමුල්ල

බී.ජී.දර්ශන

ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති

විගණකාධිපති වෙනුවට

# 4. පරිච්ඡේදය

## 4. කාර්යසාධන දර්ශක

### 4.1 ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| අංකය | විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | |
|---|---|---|---|---|
| | | 100% -90% අතර | 75%-89% අතර | 50%-74% අතර |
| 1 | දේශීය / ආයුර්වේද හා පාරම්පරික වෛද්‍ය ක්‍රම මඟින් මහජනයා හට ගුණාත්මක සේවාවන් ලබාදීම. | 95 | - | - |
| 2 | දේශීය හා පාරම්පරික වෛද්‍යක්‍රම සංරක්ෂණය / විධිමත් නියාමනය / ශික්ෂණ හා පර්යේෂණ තුළින් සංවර්ධනය කිරීම. | 98 | - | - |
| **3** | දේශීය වෛද්‍ය ක්ෂේත්‍රයට අවශ්‍ය ඖෂධ ප්‍රමාණවත්ව හා ගුණාත්මකව නිෂ්පාදනය කිරීම හා ක්ෂේත්‍රය තුළින් මෙරට තිරසර සංවර්ධනයට දායකත්වය ලබාදීම. | - | 88 | - |
| 3.1 | දුර්වල හා ආවේනික ඖෂධීය ශාක සංරක්ෂණය හා ව්‍යාප්ති සේවාවන් ප්‍රවර්ධනය කිරීම රෝහල් සඳහා අවශ්‍ය ඖෂධීය අමුද්‍රව්‍ය සම්පාදනය. | - | 80 | - |
| 3.2 | ව්‍යාප්ති හා පර්යේෂණ සඳහා දායකත්වය ලබාදීම හා ඖෂධ ශාක පිළිබඳ මහජනතාව/ප්‍රජා කණ්ඩායම් දැනුවත් කිරීම. | - | 75 | - |

## 5. පරිච්ඡේදය

# 5. තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

### 5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු

| අංක | ඉලක්කය / අරමුණු | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|
| | | | | 0%-49% අතර | 50%-74% අතර | 75%-100% අතර |
| 1 | නිරෝගී බව සහ යහපැවැත්ම | 1.1 2030 වන විට ලෝකයේ මාතෘ මරණ ආනුපාතිකය සජීවී උපත් 100,000 ට 70 දක්වා අඩු කිරීම. | ළඟා වෙමින් පවතී | | 70 | |
| | | 1.2 සියලුම රටවල්වල නවජාත මරණ අනුපාතිකය සජීවී උපත් 1000ට 12 දක්වා සහ අවුරුදු පහට අඩු ළමා මරණ සජීවී උපත් 1000ට අවම වශයෙන් 25 දක්වා අඩු කිරීමේ ඉලක්කය ඇතිව 2030 වන විට අලුත උපන් සහ වයස අවුරුදු පහට අඩු ළමුන්ගේ වළක්වාගත හැකි මරණ තුරන් කිරීම. | ළඟා වෙමින් පවතී | | 70 | |
| | | 1.3 2030 වන විට ඒඩ්ස, ක්ෂය රෝගය, මැලේරියා ඇතුළු නොතකා හැර ඇති සර්ම කලාපීය වසංගත, හෙපටයිටිස, ජලය මඟින් ඇතිවන රෝග සහ අනෙකුත් බෝවන රෝග තුරන් කිරීම. | ළඟා වෙමින් පවතී | | | 80 |
| | | 1.4 2030 වන විට බෝ නොවන රෝග නිසා සිදු වන අකල් මරණ, ප්‍රතිකාර මඟින් හා වළක්වා ගැනීමේ ක්‍රම මඟින් තුනෙන් එකකින් අඩු කරගැනීම සහ මානසික සෞඛ්‍යය සහ යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම. | ළඟා වෙමින් පවතී | | | 80 |
| | | 1.5 හානිකර ආකාරයට මද්‍යසාර භාවිතය සහ අන්තරායකාරී ඖෂධ භාවිතය වැළැක්වීමේ ක්‍රියාමාර්ග සහ ප්‍රතිකාර ශක්තිමත් කිරීම. | ළඟා වෙමින් පවතී | | | 80 |
| | | 1.6 2030 වන විට මහාමාර්ගවල සිදු වන අනතුරුවලින් සිදු වන තුවාල වීම් සහ මරණ සංඛ්‍යාව අඩු කිරීම. | ළඟා වෙමින් පවතී | | 70 | |
| | | 1.7 2030 වන විට පවුල් සැලසුම් ක්‍රම පිළිබඳ තොරතුරු සහ අධ්‍යාපනය ද ඇතුළත්ව ලිංගික සහ ප්‍රජනන සෞඛ්‍ය සත්කාරක සෙවා සඳහා සියලුදෙනාට ම ප්‍රවේශ වීමේ අවසථා තහවුරු කිරීම සහ ප්‍රජනන සෞඛ්‍යය ජාතික ක්‍රමෝපායයන්ට සහ වැඩසටහවලට ඇතුළත් කිරීම. | ළඟා වෙමින් පවතී | | | 80 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | 1.8 මූල්‍යමය අවදානමට පත් වීම සඳහා ආරක්ෂණය ද ඇතුළත්ව ආරක්ෂාකාරී, ඵලදායී, ගුණාත්මක වශයෙන් ඉහළ සහ අඩු වියදමකින් ලබා ගත හැකි ඖෂධ එන්නත් හා අත්‍යවශ්‍ය සෞඛ්‍ය සේවාවන් සියලුදෙනාටම ලබාගත හැකි වීම ඇතුළුව විශ්වීය මට්ටමින් සෞඛ්‍ය පහසුකම් ලබාගැනීමට හැකි වීම. | ළඟා වෙමින් පවතී | - | - | - |
| | | 1.9 2030 වන විට හානිකර රසායනික, වාතය, ජලය සහ පස දූෂණය වීමත්, අපිරිසුදු වීමත් නිසා ඇති වන මරණ සහ රෝගී තත්ත්වයන් සැලකිය යුතු මට්ටමින් අඩු කිරීම. | ළඟා වෙමින් පවතී | 40 | | |
| 02 | **සුනිසි මෙහෙවර සහ ආර්ථික වර්ධනය** | 2.1 ජාතික තත්ත්වයන්ට අනුකූලව ඒක පුද්ගල ආර්ථික වර්ධනය පවත්වාගෙන යෑම සහ විශේෂයෙන්ම අවම වශයෙන් සංවර්ධනය වී ඇති රටවල් වසරකට අවම වශයෙන් 7% ක දළ ජාතික නිෂ්පාදිතයේ වර්ධනයක් පවත්වාගෙන යෑම. | ළඟා වෙමින් පවතී | | 65 | |
| | | 2.2 විවිධාංගීකරණය, තාක්ෂණය ඉහළ නැංවීම, සහ නවෝත්පාදනය තුළින් සහ ඉහළ වටිනාකම් එකතු කරන ලද සහ ශ්‍රමය සඳහා වැඩි ඉල්ලුමක් ඇති ක්ෂේත්‍ර පිළිබඳ අවධානය යොමු කිරීම තුළින් ඉහළ මට්ටමේ ආර්ථික නිෂ්පාදිතයක් ලබාගැනීම. | ළඟා වෙමින් පවතී | | | 80 |
| | | 2.3 ඵලදායී ක්‍රියාකාරකම්වලට, සුනිසි රැකියා අවස්ථාවන්ට, ව්‍යවසායකත්වයට සහ නිර්මාණශීලීභාවයට සහාය දක්වන්නා වූ සංවර්ධනාත්මක දිශානතියකින් යුත් ප්‍රතිපත්තීන් ප්‍රවර්ධනය කිරීම. මූල්‍ය සේවාවන්ට ප්‍රවේශ වීමට අවස්ථාව සලසමින් ක්ෂුද්‍ර, කුඩා පරිමාණ සහ මධ්‍යම ප්‍රමාණයේ ව්‍යවසායන් පිහිටුවීම සහ සංවර්ධනය කිරීම දිරිගැන්වීම. | ළඟා වෙමින් පවතී | | | 75 |
| | | 2.4 2030 දී, තිරසර පරිභෝජනය සහ නිෂ්පාදනය පිළිබඳ දස අවුරුදු වැඩසැලැස්මට අනුකූලව, ලෝක නිෂ්පාදනයේ සහ පරිභෝජනයේදී සම්පත් උපයෝජනය කාර්යක්ෂම කිරීම සහ ආර්ථික සංවර්ධනයේදී පරිසරයට හානි සිදුවීම නැවත්වීමට ක්‍රියාමාර්ග ගැනීම ප්‍රගතිශීලී ආකාරයට වර්ධනය කිරීම. මෙහිදී සංවර්ධනය වූ රටවල් පෙරමුණ ගනු ලැබේ. | ළඟා වෙමින් පවතී | | | 80 |
| | | 2.5 2030 වන විට ආබාධිත පුද්ගලයින් සහ යෞවනයින් ද ඇතුළත්ව සියලුම කාන්තාවන් සහ පිරිමින් සඳහා ඵලදායී සහ සුනිසි රැකියා අවස්ථාවන් ලබාදීම | ළඟා වෙමින් පවතී | | 65 | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | 2.6 2030 වන විට අධ්‍යාපනය නොලබන, පුහුණුවක් නොලබන, රැකියාවක් නොමැති යෞවනයින්ගේ සංඛ්‍යාව සැලකිය යුතු මට්ටමින් අඩු කිරීම. | ළඟා වෙමින් පවතී | | 60 | |
| | | 2.7 බලහත්කාරයෙන් ශ්‍රමය ලබාගැනීම තුරන් කිරීම සඳහා වහාම ඵලදායී ක්‍රියාමාර්ග ගැනීම, කාන්තාවන් වහල් සේවයේ යෙදවීම සහ මානව කුට්ටනය අවසන් කිරීම සහ ළමුන් සොල්දාදුවන් වශයෙන් බඳවා ගැනීමද ඇතුළත්ව අතිශය නරක ආකාරයෙන් ළමා ශ්‍රමය යොදා ගැනීම තහනම් කිරීම සහ තුරන් කිරීම සහ 2025 වන විට සියලුම ආකාරයේ ළමා ශ්‍රමය යොදා ගැනීම අවසන් කිරීම. | ළඟා වෙමින් පවතී | 50 | | |
| | | 2.8 කම්කරු අයිතිවාසිකම් ආරක්ෂා කිරීම. විශේෂයෙන්ම සංක්‍රමණික කාන්තාවන් ඇතුළු සංක්‍රමණිකයින් සහ අවදානම් සහගත රැකියාවල නිරතවූවන් ඇතුළත්ව වැඩකරන සියලුදෙනා සඳහා ආරක්ෂාකාරී සහ ප්‍රවේසම්සහගත සේවා ස්ථාන සහිත පරිසරයන් ප්‍රවර්ධනය කිරීම. | ළඟා වෙමින් පවතී | | 70 | |
| | | 2.9 2030 වන විට දේශීය සංස්කෘතිය, නිෂ්පාදනය සහ රැකියා අවස්ථා ප්‍රවර්ධනය කරන්නා වූ තිරසාර සංචාරක කර්මාන්ත පිළිබඳ ප්‍රතිපත්ති සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම. | ළඟා වෙමින් පවතී | | | 80 |
| | | 2.10 සියලුදෙනාට බැංකු පහසුකම්, රක්ෂණ සහ මූල්‍ය සේවාවන් ලබාගැනීමට ප්‍රවේශ විය හැකි පරිදි දේශීය මූල්‍ය ආයතනවල ධාරිතාවන් ශක්තිමත් කිරීම. | - | - | - | - |

## 5.2 තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

**ජයග්‍රහණ**

1 ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ආයතන ව්‍යුහයන් ප්‍රතිසංවිධානය කිරීම.

**අභියෝග**

1 පවතින අණපනත් සහ වෙනත් නීත්‍යානුකූල සාධකවල බලපෑම.

2 විකල්ප වෛද්‍ය ක්‍රම සමඟ කටයුතු කිරීමේදී ඇති වන විවිධ බාධාවන්.

3 සම්පත් හිඟතාව සහ දත්ත එක්රැස් කිරීමේ පවතින දුර්වලතා.

4 මානව හා භෞතික සම්පත් හිඟය.

# 6. පරිච්ඡේදය

## 6. මානව සම්පත් පැතිකඩ

### 6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

| සෙවක් වර්ගය | අනුමත සෙවක් සංඛ්‍යාව | පවතින සෙවක් සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|
| ජ්‍යෙෂඨ P | 735 | 549 | 132 |
| තෘතීයික | 38 | 3 | 35 |
| ද්විතියික | 580 | 258 | 322 |
| ප්‍රාථමික | 1040 | 804 | 236 |

### 6.2 මානව සම්පත් සංවර්ධනය

| අංකය | වැඩසටහනේ නම | පැවැත්වූ ආයතනය | සහභාගි වූ නිලධාරීන් | වැඩසටහනේ කාලසීමාව | පාඨමාලා ගාසතුව (රුපියල්) |
|---|---|---|---|---|---|
| 1 | නිවාඩු ලිපිකරුවන්ගේ කාර්යභාරය හා වගකීම | Skill Development Fund Ltd | 2 | 2024.02.29 සහ 2024.03.01 | 26,000.00 |
| 2 | දෙමළ භාෂා ප්‍රවීනතාවය - පැය 150 | ආයුර්වේද දෙපාර්තමේන්තුව | 35 | 2024.03.12 – 2024.07.11 | 112,500.00 |
| 3 | Workshop on Advance Excel - 2024 | ශ්‍රී ලංකා පදනම් ආයතනය | 8 | 2024.09.27 සහ 28 | 132,000.00 |
| 4 | Development of Supervisors | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | 2 | 2024.10.30 | 10,000.00 |
| 5 | Leadership Development | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | 7 | 2024.10.24 | 35,000.00 |
| 6 | කාර්යාල සටහන් ලිවීම හා රාජකාරී ලිපි ලිවීම | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | 4 | 2024.10.29 | 20,000.00 |

## 7. පරිච්ඡේදය

# 7. අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කරගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී මඟ හරවා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ, ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **1** | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | | |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම. | අනුකූල වේ | | |
| 1.3 | ව්‍යාපාර හා නිෂපාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | අදාළ නොවේ | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | අදාළ නොවේ | | |
| 1.5 | විශෙෂ අත්තිකාරම් ගිණුම් | අදාළ නොවේ | | |
| 1.6 | වෙනත් | අදාළ නොවේ | | |
| **2** | **පොත් පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ 445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව සථාවීර වත්කම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම. | අනුකූල වේ | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | | |
| 2.5 | සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | | |

| අංකය | අදාළ කරගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී මඟ හරවා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ, ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | | |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | | |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | | |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | | |
| **3** | **මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ 135)** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම. | අනුකූල වේ | | |
| 3.2 | මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම. | අනුකූල වේ | | |
| 3.3 | සෑම ගණුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම. | අනුකූල වේ | | |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිත කිරීමේදී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම. | අනුකූල වේ | | |
| **4** | **වාර්ෂික සැලසුම් සකස කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලසම ්සකස කිරීම. | අනුකූල වේ | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැසම ්සකස කිරීම. | අනුකූල වේ | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැසම සකස කිරීම. | අනුකූල වේ | | |
| 4.4 | වාර්ෂික ඇසතමේන්තුව සකස කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NDB) නියමිත දිනට ඉදිරිපත් කිරීම. | අනුකූල වේ | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| **5** | **විගණන විමසුම** | | | |

| අංකය | අදාළ කරගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී මඟ හරවා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ, ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **6** | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ 134(2) DMA/1 – 2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැසම සකස කිරීම. | අනුකූල වේ | | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම. | අනුකූල වේ | | |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම. | අනුකූල වේ | | |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව. සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| **7** | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම. | අනුකූල වේ | | |
| **8** | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කිරීම. | අනුකූල වේ | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම. | අනුකූල වේ | | |

| අංක | අදාළ කරගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී මඟ හරවා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ, ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්ථා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකර තිබීම. | අනුකූල වේ | | |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම. | අනුකූල වේ | | |
| **9** | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම. | අනුකූල වේ | | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම. | අනුකූල නොවේ | ප්‍රායෝගික ගැටලු | දෙපාර්තමේන්තුව මඟින් සිදු කිරීම |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කරගෙන පවත්වාගෙන යාම. | අනුකූල වේ | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම. | අනුකූල වේ | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම. | අනුකූල වේ | | |
| 9.6 | කල්බදු කාලසීමාවෙන් අනතුරුව, බදු වාහනවල ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම. | අනුකූල වේ | | |

| අංකය | අදාළ කරගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී මඟ හරවා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ, ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **10** | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| 10.2 | සමාලොචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිවැරදි කර තිබීම. | අනුකූල වේ | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශෙෂ ස්ම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශෙෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම. | අනුකූල වේ | | |
| **11** | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම. | අනුකූල වේ | | |
| 11.2 | මු.රෙ 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළැඹීම. | අනුකූල වේ | | |
| **12** | **රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන්වලට අනුකූල වීම. | අනුකූල වේ | | |
| 12.2 | හිඟ හිටි ණය ශෙෂ පිළිබඳ කාල විශලේෂණයක් සිදුකර තිබීම. | අනුකූල වේ | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවැත එන හිඟ හිටි ණය ශෙෂ නිරවුල්කර තිබීම. | අනුකූල නොවේ | පැරණි ණය සම්බන්ධයෙන් තොරතුරු ප්‍රමාණවත් නොවීම | වර්තමානයේ ණය නිරවුල් කිරීම විධිමත් පරිදි සිදු වේ. |

| | | | | |
|---|---|---|---|---|
| **13** | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතුකර තිබීම. | අනුකූල වේ | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීනකර පවත්වාගෙන යාම. | අනුකූල වේ | | |
| **14** | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශෙෂය් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට පේෂණයකර තිබීම. | අනුකූල වේ | | |
| 14.2 | මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්යය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල්කර තිබීම. | අනුකූල වේ | | |
| 14.3 | මු.රෙ 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්යය අතුරු අග්‍රිම නිකුත්කර තිබීම. | අනුකූල වේ | | |

| අංකය | අදාළ කරගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී මඟ හරවා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ, ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **15** | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාළ රෙගුලාසිවලට අනුකූලව, රැස ක්ළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදුකර තිබීම. | අනුකූල වේ | | |
| 15.2 | රැස ක්ර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකර සෘජුවම ආදායමට බැර කරතිබීම. | අනුකූල වේ | | |
| 15.3 | මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත්කර තිබීම. | අනුකූල වේ | | |
| **16** | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්යමණ්ඩල සීමාව තුළ කාර්යමණ්ඩලය පවත්වාගෙන යාම. | අනුකූල වේ | | |
| 16.2 | කාර්යමණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිසතු'ලිඛිතව ලබා දී තිබීම. | අනුකූල වේ | | |
| 16.3 | 20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සෙවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත්කර තිබීම. | අනුකූල වේ | | |
| **17** | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියකු පත්කර තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම. | අනුකූල වේ | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පළ කිරීමට අවසථාව සලසා තිබීම. | අනුකූල වේ | | |

| අංකය | අදාළ කරගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී මඟ හරවා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ, ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **18** | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018 දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනයකර ක්‍රියාත්මකකර තිබීම. | අනුකූල වේ | | |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදයේ පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස්කර තිබීම. | අනුකූල වේ | | |
| **19** | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස්කර තිබීම. | අනුකූල වේ | | |
| 19.2 | කාර්යමණ්ඩලයේ සෑම සාමාජිකයකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12ට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරුකර තිබීම. | අනුකූල වේ | | |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්යමණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන්කර තිබීම. | අනුකූල නොවේ | පවතින මානව භෞතික සම්පත් අනුව මෙම කටයුතු නිවැරදිව ක්‍රියාත්මක | ඉදිරියේදී අවශ්‍ය මානව හා භෞතික සම්පත් ලැබීම අනුව කටයුතු කරනු ලැබේ. |

| අංකය | අදාළ කරගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී මඟ හරවා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ, ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 19.4 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කර තිබීම. | අනුකූල වේ | | |
| **20** | **විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදිකර තිබීම. | අනුකූල වේ | | |